# ගුවන් විදුලි ප්‍රවෘත්තිකරණයේ න්‍යාය හා ව්‍යවහාරය

**එච්.ඩී.ඊ ගුණසේකර**

**ශාස්ත්‍රවේදී විශේෂ (ජනසන්නිවේදනය-කැලණිය), දර්ශනපති (ජනසන්නිවේදනය-කැලණිය),ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හිටපු ප්‍රවෘත්ති සංස්කාරක සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මාධ්‍ය නිලධාරි.**

## තොරතුරු සහ ප්‍රවෘත්ති

මාධ්‍යවේදය ශිල්පයකට වඩා වැඩියමකි. කර්මාන්තයකටද වඩා වැඩි යමකි. එය කලාවක් හා අමාත්‍යාංශයක් අතර පවතින යමකි. මාධ්‍යකරුවෝ මහජනතාවට සේවය කිරීම තම අරමුණු කර ගත් නිල නොවන මහජන සේවකයන් වෙති. සියල්ල ආරම්භ වූයේ ඉතා සීමා සහිත පිරිසක් විසින් දුම් සංඥා හා ගල් බිත්ති වල චිත්‍ර සහ ලිපි තේරුම් ගැනීමෙනි. රූපවාහිනිය, පුවත්පත් හා ගුවන් විදුලිය අපගේ ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් කර තිබේ. (**දිසානායක , 1999, පිටු : 04**). තත්පර කීපයක් ඇතුලත දුන් තොරතුරු විශ්වය පුරා පැතිරෙන අතර ඒවා සියලු දෙනාටම ලබා ගත හැකිය. Information හා News යන ඉංග්‍රීසි පද දෙක තොරතුරු හා ප්‍රවෘත්ති යනුවෙන් ජනසන්නිවේදන ක්ෂේත්‍රයෙහි විද්‍යාමාන වේ. තත්පරයක් තුළ ලෝකයේ කවර හෝ තැනක කිසිවෙකුට කිසියම් දෙයක් සිදු වෙයි. ස්වභාව ධර්මයේ බලපෑම් සහිතව හෝ රහිතව මෙසේ සිදුවන සංසිද්ධි ආදිය වාචිකව හෝ ලිඛිතව ඉදිරිපත් වන්නේ තොරතුරු මඟිනි. පුද්ගලයන්ට, ස්ථානවලට, ස්වභාව ධර්මයට සිදුවන්නා වූත් මුහුණ පාන්නට වන්නාවූත් එවැනි ලක්ෂ කෝටි සංඛ්‍යාත සංසිද්ධි වලින් ලෝකය පිරී පවතී. එවැනි සංසිද්ධි සම්බන්ධ තොරතුරු පුද්ගලයාගෙන් පුද්ගලයාට සන්නිවේදනය වෙයි. එහෙයින් මිනිසා සමාජයක ජීවත් වීමේදී අසන දකින මෙවැනි සංසිද්ධි තොරතුරු කෙරෙහි ප්‍රතික්‍රියා දක්වන්නට පටන් ගනී. ඒ නිසා ඇතිවන ක්‍රියාවලිය සමාජයේ යහ පැවැත්මට හේතු සාධකයකි. (**කාරියවසම්, 1993, පිටු :01**) සංකීර්ණ ශිෂ්ටාචාරයක පැවැත්මට එවැනි තොරතුරු අත්‍යවශ්‍ය වේ. එවැනි තොරතුරු වල අවශ්‍යතාව සහ ඒවා දැන ගැනීම මිනිස් ශිෂ්ටාචාරයේ ඉතිහාසය තරම්ම පැරණිය. ලෝකය ගැන තොරතුරු දැනගන්නට මිනිසාට ඇති නොවැලැක්විය හැකි ආශාව හා කුතුහලය එක් යුගයකට පමණක් සීමා වන්නක් නොවේ. නමුත් හැම තොරතුරක්ම ප්‍රවෘත්තියක් වශයෙන් සැළකිය නොහැකිය. ජනමාධ්‍ය මඟින් සිදු කරන්නේ තොරතුරු වලින් තෝරාගත් සමහරක් වාර්තා කොට තබා ගැනීම, අර්ථකතනය කිරීම හෝ ඒ සම්බන්ධ මත ප්‍රකාශ කිරීම පමණකි. (**කාරියවසම් , 1993, පිටු :02**) එහෙයින් ලෝකයේ සිදුවන ලක්ෂ සංඛ්‍යාත ගණනක් වන තොරතුරු වලින් ජනමාධ්‍ය මඟින් ඉදිරිපත් කිරීමට යම් කිසි වැදගත්කමක්, වටිනාකමක් ඇත්තේ කුමක්ද ඒවා ප්‍රවෘත්ති ගණයට වැටේ.

ප්‍රවෘත්ති යනු සිත් ගන්නා සුළු වාර්තාවකි. ඒවාට පදනම් වන්නේ මිනිසුන් සිතන පතන දකින කියන කරන විස්තර පිළිබඳ වැදගත් වූ නිවැරදි වූත් තොරතුරුය. (ගුණසේකර, 1998, පිටු : 13) මෙකී ප්‍රවෘත්ති පිළිබඳව විවිධ පුද්ගලයන් විසින් විවිධ අර්ථකතන ගෙනහැර දක්වා ඇත. ඇමරිකානු පුවත්පත් කලාවේදියකු වන මිලාර්ඩ් විලේයර්ගේ අදහස නම් කාලීන වූත් වැඩිදෙනා උනන්දු වන සුළු වූත් සියලු තොරතුරු ප්‍රවෘත්ති ගණයෙහිලා සැළකිය හැකි බවයි.

16 වන සියවසේදී “ප්‍රවෘත්ති ” යන සංකල්පය අර්ථකතනය කළේ “සතර දිග්භාගයෙන් ගලා එන පුවත් ” යන අර්ථයෙනි. ඒ අනුව ප්‍රවෘත්ති යන්න නිර්මාණය වී තිබෙන්නේ සතර දිසාවල එනම්, උතුර (North) නැගෙනහිර (East) බස්නාහිර (West) හා දකුණ (South) යන දිශා හඳුන්වන ඉංග්‍රීසි වචන වල මුලකුරු වල එකතු වීමෙන් බව පිළිගැනීමෙනි. (සෙනෙවිරත්න, 2007, පිටු : 01) නමුත් මෙම හැඳින්වීම වැරදි සහගත බව අද අලුත්ම මතය වී තිබේ. (News) යන වදන නවතාව හෙවත් නවල්ටීස්

(Novelties) හා නිව්ස්නස් (Newness) යන්නෙන් බිඳී ආ බව මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් සිය සන්නිවේදන ශබ්දාකරය නැමැති කෘතියේ සඳහන් කරයි. (මහේන්ද්‍ර, **1997**, පිටු : **204**)

ප්‍රවෘත්ති පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන අතර පෝල් ඞී මැසෙනියර් විසින් ඉදිරිපත් කර ඇති නිර්වචනයද ඉතා වැදගත් වේ. ප්‍රවෘත්ති යනු ජනතාවට බලපාන්නාවූත් ඔවුන් තුළ උනන්දුවක් ඇති කරන්නාවූත් මෑත කාලීන වැදගත් සිදුවීමකට අදාළ අලුත් තොරතුරක් බව ඔහු පවසයි. මැල්වින් එල් ඩෙෆලර් හා එවරට් ඩෙනිස් යන විශ්ලේෂකයන්ට අනුව ප්‍රවෘත්ති යනු සැළකිය යුතු ජන සංඛ්‍යාවකගේ උනන්දුව දනවන සිද්ධියක් හෝ විෂයක් හෝ පවත්නා හා අලුත්ම තොරතුරු ඒකරාශී කර ප්‍රවෘත්ති ක්‍රියාවලියක් මගින් ජනතාවට ඉදිරිපත් කරන දෑය. (විජේකෝන්, **2006**, පිටු : **82**) වෘත්තීය ප්‍රවෘත්ති ප්‍රකාශකයන් විසින් මහජනතාව අතට පත්වන ආකාරයේ හා මහජනයාට අවබෝධ කර ගත හැකි පරිදි යම් කිසි පියවර හෝ අවධිදාමයක් මඟින් අලුත් තොරතුරු ඒකරාශී කර ජනමාධ්‍ය හරහා විසුරුවා හැරීම ප්‍රවෘත්ති ක්‍රියාවලියයි.

"නිව්යෝර්ක් සන් " පුවත්පතේ කතෘවරයකුව සිටි චාල්ස් ඒ ඩනා පවසන්නේ ප්‍රවෘත්ති යනු සමාජයේ වැඩි දෙනෙකුට වැදගත් වන හා මේ තාක් කිසි දිනෙක ඔවුන්ගේ අවධානයට ලක් නොවුනු දෙයක් බවයි. (සෙනෙවිරත්න, **2007**, පිටු : **02**) එමෙන්ම ඔහු දක්වන අන්දමට "බල්ලෙකු විසින් මිනිසෙකු සපා කෑම ප්‍රවෘත්තියක් නොවන අතර මිනිසෙකු විසින් බල්ලෙකු සපා කෑම ප්‍රවෘත්තියක් වේ".

(when a Dog bite a man that is not a news. But when a man bites a dog that is a news) (රාජපක්ෂ, **2009**, පිටු : 63)

වාල්ස් ඩනා විසින් ප්‍රවෘත්ති සංකල්පය ඉදිරිපත් කර ඇත්තේ සමාජයේ කේන්ද්‍රකර ගනිමින් බව මේ අනුව පැහැදිලිය. ඔහුගේ මෙම විග්‍රහය තුළ නවත්වය සහ මානව වැදගත්කම යන ලක්ෂණ දෙක අන්තර්ගත වන බව පෙනී යයි.

ඇමරිකානු පුවත්පත් කලා ක්ෂේත්‍රයේ පුරෝගාමියකු වූ "මිලර්ඩ් විලේයර්" ගේ මතය අනුව කාලීන වූද වැඩි දෙනෙක් උනන්දු වන ඕනෑම දෙයක් ප්‍රවෘත්තියක් වෙයි. අති විශාල දෙනෙක් උනන්දු වන තොරතුරු මේ අනුව හොඳම ප්‍රවෘත්ති වෙයි. තවද කළක් ඇමරිකානු "නිව්යෝර්ක් ටයිම්ස්" පත්‍රයේ කලාවේදියකුව සිටි මහාචාර්ය හර්බට් පුල්ගේ මතය අනුව ප්‍රවෘත්ති යනු ක්‍රියාකාරී විද්‍යාමාන අදහසකි. එම නිසා එය සාම්ප්‍රදායික නිර්වචනයකට නැගීම දුෂ්කරය. සන්නිවේදනය මෙන්ම ප්‍රවෘත්ති ද ක්‍රියාවලියකි. (පියදාස, **1993**, පිටු : **43**) එමෙන්ම "පුවත්පත් කලාව" ග්‍රන්ථය ලියූ "සමන් තිලකසිරි" දක්වන පරිදි ඕනෑම කෙනෙකු තොරතුරු දැනගැනීමට කැමැත්තක් දක්වන හැම සිද්ධියක්ම ප්‍රවෘත්ති වන අතර ඒවා දැන ගැනීමේ ආශාවෙන් පෙළෙන මිනිසුන්ට මෙබඳු තොරතුරු රැසක් කියවන්නට සැලැස්වීම පුවතක ප්‍රධාන කටයුත්තකි.

ප්‍රධාන ලේඛකයකු වන මැක්ර්චන් සඳහන් කර ඇත්තේ පාඨකයා විසින් ප්‍රවෘත්ති ලෙස කියා ගන්නා ඕනෑම දෙයක් ප්‍රවෘත්ති වන බවයි. මිනිසාගේ ජීවිතයේ උපත, ළමා විය, විවාහය, සැදෑ සමය, මරණය ඇතුලු කවර අවස්ථාවකදී ප්‍රදර්ශන තත්වයක් ඉතිහාසඥයින්, ජනමාධ්‍යවේදීන් විසින් පෙන්වා දෙයි. ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්ය රොබට් ඩර්න්ටොන් ගේ අදහස වන්නේ ප්‍රවෘත්ති මිනිස් ක්‍රියාකාරකම් වලට සීමා කරයි යන්නයි. (වලේබොඩ, **2010**, පිටු : **23**) එමෙන්ම අති විශාල තොරතුරු අතරින් "වාර්තා කිරීම" ප්‍රවෘත්ති වන අතර එම ද්විතියික එනම් වාර්තාකරණ ක්‍රියාවට පාදක සාධකය වන්නේ වාර්තා කිරීම සඳහා වැදගත් වීමයි. (Mencher, 1999, P 55) මේ අනුව පෙනී යන්නේ වාර්තා කිරීම සඳහා වැදගත් වන තොරතුරු පමණක් ප්‍රවෘත්ති ලෙස වාර්තා කරන බවයි. විශේෂයෙන් ග්‍රාහකයන් විසින් කියවනු ලබන්නේ, අසනු ලබන්නේ, නරඹනු ලබන්නේ මොනවාද යන්න තොරතුරු ප්‍රවෘත්තියක් බවට පත් කිරීමේ ක්‍රියාවලියේ ආරම්භක ප්‍රවේශයක් බවට පත්වේ. (Dennis, **1994**, P: **336**)

ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේදී "ප්‍රවෘත්ති යන්න විග්‍රහ කර ඇත්තේ ආරංචි අලුත් තොරතුරු, මෙන්ම අලුත් සිදුවීම් පිළිබඳ කරන ලද වාර්තාවක් ලෙසයි." "ප්‍රවෘත්ති " යනු ජනතාවට බලාපොරොත්තුවන්නා වූත් ඔවුන් තුළ උනන්දුවක් ඇති කරන්නා වූත් මෑත කාලීන හා වැදගත් සිදුවීමකට අදාල වන්නාවූත් තොරතුරුය. යනුවෙන් ආසියා ශාන්තිකර ගුවන් විදුලි සංවර්ධන ආයතනය (AJDE ) පළකල Here is the News නැමැති අත්පොතෙහි විග්‍රය කර ඇත. (සෙනෙවිරත්න, **2007,** පිටු : **03**) මේ නිර්වචනය වඩාත් ප්‍රායෝගික නිර්වචනයක් ලෙස පෙනෙන අතර ප්‍රවෘත්තියක අත්‍යාවශ්‍යයයෙන්ම තිබිය යුතු ලක්ෂණ පිළිබඳවද අවබෝධ කරවා තිබේ.

**1969** පමණ වන විට ප්‍රවෘත්තිය යන්න නිර්වචනය කරන ලද්දේ යම්කිසි මාධ්‍යයක් ප්‍රයෝජනයට ගෙන වාර්තා කරන ලද සිද්ධියක් යනුවෙනි. (විජේකෝන්, **2006**, පිටු : **82**) එම සිද්ධිය ප්‍රවෘත්තියක් වන්නේ කිසියම් මාධ්‍යයක් ඔස්සේ වාර්තා වූ විට පමණි. එහෙත් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ලොව බිහිවූ පසු ප්‍රවෘත්තිය යන්න හුදෙක් අතීත සිද්ධියක වාර්තාවකට වැඩියෙන් වර්තමානයේ සිදු වන සිද්ධි සමුදායන් රැසක් පිළිබඳ විවරණයක් බවට පත් වෙමින් තිබේ. ප්‍රවෘත්තියක් යනු වාක්‍යයක් හෝ ඡේදයක් යන සරල අර්ථයෙන් අවබෝධ කර ගත හැක්කක් නොවේ. ප්‍රවෘත්තියකට ස්ථානික අරමුණක් තිබේ. එසේම එය සංකීර්ණ ක්‍රියාවලියකින් සමන්විත වූවකි. මූලයකින් ආරම්භවන තොරතුරු වාර්තා කිරීමෙන් ප්‍රවෘත්තියක් බවට පත්වේ. එය වාරණ ක්‍රියාවලියකට යටත් වන අතර වාර්තාකරු, ප්‍රවෘත්ති අධ්‍යක්ෂක, ප්‍රවෘත්ති සංස්කාරවරයාගෙන් පසු ප්‍රචාරය කිරීමට යොමු කරනු ලැබේ. (වලේබොඩ**, 2010,** පිටු : **23**) ප්‍රවෘත්තියකට සුදුසු ඉඩ මාධ්‍යයේ ලබා දීම තීරණය වන්නේ එහි පවතින වැදගත්කමකට අනුවය. ප්‍රචාරය සඳහා ප්‍රවෘත්තියක් තෝරා ගැනීමේදී එමගින් ලැබෙන ප්‍රචාරාත්මක වැදගත්කම නීතිමය ගැටළු ඇති කරන්නේද යන්න සැළකිල්ලට ගනු ලැබේ. ප්‍රවෘත්තියක් ප්‍රචාරය වන්නේ සංස්කරණ ක්‍රියාවකින් පසුය. මේ අනුව ප්‍රවෘත්තිය තොරතුරකින් ආරම්භ වී ග්‍රාහකයා කරා ලඟා වනුයේ සංකීර්ණ ක්‍රියාදාමයකින් පසුවය. ප්‍රවෘත්තියක් තෝරා ගැනීමේදී පසුබිම සළකා බැලීමේදී එය සංස්කෘතික, ආර්ථික, දේශපාලනික, හා සමාජ යනාදී කරුණු රැසක් නියෝජනය කරන බව පෙනේ. වර්තමානයේ ප්‍රවෘත්තියක් යනු ලාභ ලබා දෙන මාර්ගයකි. ප්‍රවෘත්ති ආයතනයක් ස්වකීය කාර්යක්ෂමතාව තුල මෙම ලාභ ලබා ගැනීමේ කාර්යය මැනවින් සිදු කරයි. (Lambert, 1977, P: 21) සම්මුඛ සාකච්ජා සිදු කරමින් ග්‍රාහකයන්ට ලබා දිය යුතු කරුණු සැලකිලිමත්ව වාර්තා කරයි. තම ප්‍රවෘත්ති ආයතනය සමඟ කටයුතු කරන සංවිධාන, වෙළඳ සමාගම්, පුද්ගලයන් පිළිබඳව සුහදතාව පවත්වා ගැනීමත් එක් උපක්‍රමයකි. එසේම තම තොරතුරු ලබා දීම මගින් ග්‍රාහකයා රඳවා ගැනීමද තවත් අරමුණකි.

ප්‍රවෘත්ති පිළිබඳව විමසා බැලීමේදී රූපවාහිනි ප්‍රවෘත්ති පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය. රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රබලය. එය කියවා බැලීම පමණක් නොවේ. පෙන්වීමද කරයි. (දිසානායක, **1999**, පිටු : **04**) බොහෝ දෙනෙකුට රූපවාහිනි ප්‍රවෘත්ති විශ්වාසවන්තය. රූපවාහිනි ප්‍රවෘත්ති වෙනුවෙන් වැඩ කරන වාර්තාකරුවෙකු කැමරා ශිල්පියෙකු, ශබ්ද ශිල්පියෙකු, සංස්කාරවරයකු, වශයෙන් සියළු දෙනාටම විශාල වගකීමක් ඇත. මේ අනුව "ප්‍රවෘත්ති" මානව ජන ජීවිතය හා සමීපව බැඳී පවතින්නක් බව ගම්‍ය වේ.

## ප්‍රවෘත්ති මූලිකාංග

ඕනෑම මාධ්‍ය ආයතනයක හදවත ලෙස ප්‍රවෘත්ති අංශය සැළකෙයි. එනම් මාධ්‍ය ආයතනයේ රඳා පවතින්නේ "ප්‍රවෘත්ති" මතය. ප්‍රවෘත්තියක මූලික අංග ලෙස අර්ථ දක්වනුයේ තොරතුරක් ප්‍රවෘත්තියක් ලෙස හඳුනා ගැනීමට, තෝරා ගැනීමට බලපාන සාධක සමූහයයි. අසීමිත තොරතුරු සමූහයක් ලොව පුරා පවතින නමුදු ඒවා වාර්තා නොකිරීම නිසා මානව මතකය හා නොගැටී වැළලී යයි. මෙම සැම තොරතුරක්ම වාර්තා නොවන්නේ ඒවායේ පවතින ප්‍රවෘත්ති මූලිකාංගමය වැදගත්කමක් නැති නිසාම නොවේ. ප්‍රායෝගික වශයෙන් වාර්තා කිරීමට නොහැකිවීම නිසාද ප්‍රවෘත්තියක් බවට පත්

නොවන තොරතුරු තිබේ. මෙම ප්‍රායෝගිකත්වය භූගෝලීය සාධක, නොදැනුවත්කම , මාධ්‍ය හා පවතින දුරස්ථකම ඇතුළු සමාජීය සාධක රැසක් මත තීරණය වේ.

ප්‍රවෘත්ති මූලිකාංග විවිධ ආකාරයට විග්‍රහ කර තිබෙන අතර විශ්වමය වශයෙන් පිළිගැනීමට ලක් වූ මූලිකාංග **10** ක් දක්නට ලැබේ. (Lamkbert, **1990,: P 24**)

1. සමීප බව
2. කාලීන බව
3. ප්‍රකට බව
4. අපූර්වත්වය
5. බලපෑම
6. ගැටුම
7. මානව උනන්දුව
8. අවිනිශ්චිත බව
9. පැහැදිලි බව
10. නිශ්චිත බව

සමීප බව ප්‍රවෘත්තියක තිබිය යුතු මූලික ලක්ෂණයකි. ප්‍රවෘත්තියකට හසුවන ග්‍රාහකයා වඩාත් ඇලුම් කරන්නේත්, බලාපොරොත්තු වන්නේත් තමාට ඉතා සමීප සිද්ධි හා අවස්ථා පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමටයි. නූතන ප්‍රවෘත්ති කලාව තුළ සමීප බව සංකල්පය ප්‍රභේද දෙකක් යටතේ විග්‍රහ කරයි. (සෙනෙවිරත්න, **2007, පිටු : 09**)

01. භූගෝලීය සමීබ බව

02. ජන ජීවිතය සමග පවත්නා සම්බන්ධතාවය

දේශීය හා විදේශීය වශයෙන් ප්‍රවෘත්තියට අදාළ ප්‍රදේශයට බලපාන සිද්ධි හා අවස්ථා භූගෝලීය සමීපබව වශයෙන් අර්ථ දැක්වේ. බොහෝ ග්‍රාහකයින් වඩාත් කැමති වන්නේ තම ප්‍රදේශයට බලපානු ලබන, නැතහොත් ප්‍රදේශය ආවරණය කෙරෙන ප්‍රවෘත්ති දැන ගැනීමටය. ජන ජීවිතය සමග පවත්නා සම්බන්ධතාවය සමීපබව යන සංකල්පයේ දෙවැන්නයි. යම් ප්‍රවෘත්තියක් තුළ පවතින සමාජයීය, සංස්කෘතික හා මානසික සමීපබව මෙමඟින් අවධාරණය කරයි. (වලේබාඩ, 2010, පිටු : 28) භූගෝලයට කොපමණ දුරින් පිහිටියද සමීප සාධකය පුද්ගලයා කෙරෙහි ඉතාම තදින් බලපායි. මානව භාවය සතු මූලික සමානකම් හා සුසැදි සමීපස්ථ සාධකය ප්‍රවෘත්තිමය වැදගත්කමක් ගන්නේ මේ හේතුවෙනි. තම ආගමික, ජාතික, දේශපාලනික, සංස්කෘතික වටිනාකම් පිළිගන්නා වෙනත් පිරිසකට අදාළ සිදුවීමක් තමාට ඉතාම සමීප ලෙස දැනෙන්නේ සමීපස්ථ සාධකය නිසාවෙනි. ඒ පිළිබඳව තව තවත් දැන ගැනීමට ඇති ඕනෑකම නිසා ප්‍රවෘත්ති ඉල්ලුම ඉහළ යයි. බාමියන් බුදු පිළිම විනාශ කිරීම ලොව පුරා බෞද්ධයන් කම්පනයට පත් කළ කරුණක් වූයේ මෙම සාධකය නිසාවෙනි.

"කාලීන බව" ප්‍රවෘත්තියක අන්තර්ගතය විය යුතු මූලිකාංගයකි. මෙමඟින් පුවතක් නව්‍ය වීම අදහස් කරනු ලබයි. (කාරියවසම්, 1993, පිටු : 13) යල් පැන ගිය ප්‍රවෘත්ති වටිනාකමක් නැති තරම්ය. යම් සිද්ධියක් යම් කළෙක වැදගත් ප්‍රවෘත්තියක් විය හැකි මෙන්ම කලෙක එය නොවැදගත් ප්‍රවෘත්තියකි. මීට වසර තිහ හතළිහකට පෙර ලංකාවේ මිනී මැරුමක් සිදුවුවහොත් එය රටේම කුතුහලය අවුස්සන්නක් විය. නමුත් අද වන විට මිනී මැරුමක් යන්න සාමාන්‍ය සිද්ධියකි. (රාජපක්ෂ, 2009, පිටු : 70) එවැනි සිදුවීමකට කාලීන බවක් එක්වන්නේ ඝාතනයට ලක්වන පුද්ගලයාගේ තත්වය මතය. එම පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂ බව මතය. අනෙක් අතට එවැනි සිදුවීමක කාලීන බව ආරක්ෂා කර ගැනීම සඳහා එයට අදාළ ප්‍රවෘත්තිය එසැනින් වාර්තා කළ යුතුය. මන්දයත් ප්‍රවෘත්තියක ජීව කාලය පවත්වා ගත හැක්කේ පැය 24ක් පමණි. පැය 24 කට පසු එම ප්‍රවෘත්තිය නැවත වරක් වාර්ත කරන්නේ නම් එහි කවර හෝ

වර්ධනයක් පැවතීම අත්‍යාවශ්‍ය වේ. (Clarrison, 1982, P:43) ඒ අනුව "කාලීන බව" අත්‍යාවශ්‍ය ප්‍රවෘත්ති මූලිකාංගයක් බව පැහැදිලිය.

"ප්‍රකට බව" ද අත්‍යාවශය ප්‍රවෘත්ති මූලිකාංගයකි. ප්‍රකට බව යන්න කැපී පෙනෙන, ප්‍රමුඛව ඉස්මතු වී පෙනෙන යන තේරුම් රසකින් අවබෝධ කර ගත හැකිය. සෙසු සියලු ප්‍රවෘත්ති වලට වඩා කැපී පෙනෙන ප්‍රවෘත්තියක් ප්‍රමුඛ පුවත ලෙස ප්‍රචාරය කිරීමෙන් ප්‍රවෘත්තියක ප්‍රකාශය වෙත ග්‍රාහක අවධානය ලබා ගත හැකිය. මෙම ප්‍රකට බව හෙවත් ප්‍රමුඛතාව පුද්ගල, ස්ථාන, සිද්ධි හා දින ලෙස ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් යටතේ හඳුනාගත හැකිය. (වලේබොඩ, 2010, පිටු : 30) මෙම කවර අංශයක වුවද ප්‍රමුඛ බව තීරණය වන්නේ එහි පවතින සමාජ බලපෑම මතය. මේ අනුව පෙනී යන්නේ ප්‍රවෘත්ති වාර්තාකරණයේදී ප්‍රකට බව අත්‍යාවශ්‍ය සාධකයක් බවයි.

ප්‍රවෘත්තියක් තුළ අපූර්වත්වයද අන්තර් ගත විය යුතුය. ප්‍රවෘත්ති අපූර්වත්ව සාධකය මත ග්‍රාහක ආකර්ශනය දිනා ගති. (කාරියවසම්, 1993, පිටු : 14) බොක්සින් තරඟයේදී මයික් ටයිසන් විසින් ස්වකීය ප්‍රතිවාදියාගේ කණ සපා කෑම තරඟයේ ප්‍රතිඵලයට වඩා ප්‍රසිද්ධියක් ලැබුවේ එහි තිබූ අපූර්වත්වය මතය. චීනයේ බෙයිජින් ඔලිම්පික් උළෙලේදී ඔලිම්පික් පහන දැල්වීමට සිය ක්‍රීඩකයා නොපෙනෙන කම්බියක් මත දිවයන අවස්ථාවේ අපූර්වත්වය වූයේ ඔහු අහසේ ගමන් කරන ආකාරයට ප්‍රදර්ශනය වීමයි.

පෞද්ගලික ජීවිතයට කරණු ලබන බලපෑමද ප්‍රධාන ප්‍රවෘත්ති මූලිකාංගයක් වශයෙන් ක්‍රියාත්මක වේ. මෙම බලපෑම පෞද්ගලිකව එක් එක් පුද්ගලයා වෙත සිදුවන අතර කණ්ඩායම් වෙත මෙන්ම සෙසු සමාජය කෙරෙහි බලපෑම් එල්ල වේ. (වලේබොඩ, 2010, පිටු : 31) බලපෑම් ප්‍රමාණය ප්‍රවෘත්තියේ වටිනාකම ඉහළ නංවයි. අත්‍යාවශ්‍ය භාණ්ඩයක මිල ඉහළ යාම, ඉන්ධන වලට බද්ධක් පැනවීම, බස් ගාස්තු ඉහළ නැංවීම ආදිය ඍජුවම සමාජය වෙත බලපායි. රට හරහා දැවැන්ත සුළි සුළඟක් හමා යාම, සුනාමි තත්වයක් ඇතිවීම වැනි ප්‍රවෘත්තිවල බලපෑම අති ප්‍රබල වූවකි. එමෙන්ම ප්‍රබල දේශපාලඥයින් කිහිපදෙනෙකු තම පක්ෂය මාරු කිරීමේ ප්‍රවෘත්තිය රාජ්‍ය බලය බිඳවැටීම කෙරෙහි බලපාන්නේ නම් එහි ඇත්තේ පොදු සමාජය කෙරෙහිම බලපෑමක් ඇති කරන මූලිකාංගයක ස්වරූපයකි.

වර්තමානයේදී ප්‍රවෘත්තියක් යනු ගැටුමක්ය, යන තරමටම හඳුන්වා දීමට ඇතැමෙක් උත්සාහ දරයි. ගැටුම පිළිබඳ තොරතුරු ඇසීමට, ගැටුම් නැරඹීමට මිනිසා තුළ පවතින ආශාව මෙම මූලිකාංගය බලපැවැත්වීමටද හේතු වී ඇත. (කාරියවසම්, 1993, පිටු : 13) දෙපිරිසක් අතර ගැටුමක් ඇති වූ විට දැඩිව හෙළා දකින පුද්ගලයන්ද එවැනි ගැටුමක් නරඹන ආකාරය දක්නට පුළුවන. ප්‍රවෘත්තිකරණයේදී තනි තනිව පවතින ගැටුම් වලට වඩා සංවිධාන හා සංවිධාන අතර, දේශපාලන පක්ෂ අතර එමෙන්ම ජාතික වශයෙන් වැදගත් පිරිස් හා කණ්ඩායම් අතර පවත්නා වූ ගැටුම් සැළකිල්ලට ගනු ලැබේ. මේ සඳහා උදාහරණයක් වශයෙන් මැතිවරණ සමයක් තුළදී ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක ආධාරකරුවන් අතර හටගත් ගැටුමක් පෙන්වා දිය හැකිය.

"මානව උනන්දුව" ද ප්‍රවෘත්ති මූලිකාංගයක් ලෙස දැක්විය හැකිය. සමාජයේ සෑම පුද්ගලයකුටම මානව ලැදියාව නැමැති ගුණය පවතී. ඉන් අදහස් වන්නේ කිසියම් වාර්තාවක් දුටු විගස ඊට ප්‍රතිචාරයක් වශයෙන් ලැබෙන චෛතසික උත්තේජනයයි. අසාමාන්‍ය තත්වයෙන් එළි දකින ප්‍රවෘත්ති මීට අයත් වේ. (සෙනෙවිරත්න, 2007, පිටු : 13) උදාහරණ වශයෙන් දෙබඩි දරු උපතක් පිළිබඳ ප්‍රවෘත්තියක් දැක්විය හැකිය. සතුන් හෝ මිනිසුන් සම්බන්ධ සංවේදන උපදවන තොරතුරු, එනම් භාව සංවේදී ප්‍රවෘත්ති පුවතක අගය තීරණය කිරීමේදී සළකා බලනු ලබයි. මේ යටතේ අරුම පුදුම සහගත ප්‍රවෘත්ති, විස්මය ජනක තොරතුරු, අශෝභන වූ සිද්ධි, අභිවෘද්ධි දක්වන ප්‍රවෘත්තිද මානව ලැදියා මූලිකාංගයට අයත් වෙයි.

ප්‍රවෘත්තියක අවසානය තෙක් සිදුවීම පිළිබඳව අවිනිශ්චිතතාවක් පැවතිය යුතුය. තීරණාත්මක සිදුවීමක අවසානය තෙක් එහි සත්‍යය අසත්‍යතාවය දැන ගැනීම සඳහා අවධානය යොමු කිරීමට සිදුවේ.

තීරණාත්මක ක්‍රිකට් තරඟයක අවසාන තත්පර කිහිපය එය පරාජය ගැන තීරණය ලබා දෙයි. මැතිවරණ ව්‍යාපාරයක තීරණාත්මකභවද උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

පැහැදිලි බවද ප්‍රවෘත්තියකට අදාළ වන මූලික අංගයකි. බොහෝ මාධ්‍යවේදීහු මෙම සාධකය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු නොකරති. (වලේබොඩ, 2010, පිටු : 34) එමෙන්ම ප්‍රවෘත්තියක් දැඩි නිශ්චිත බවකින් යුක්ත විය යුතුය. තමාට අවශ්‍ය කරන දෙයක් අනාගතයේදී සිදුවිය හැකිය. අනුමාන කරන දෙයක් පිළිබඳව ප්‍රවෘත්ති මඟින් අවිනිශ්චිතව කරුණු දැක්වීම විශ්වසනීයත්වයට අභියෝගයකි. එනම් අනිවාර්යයෙන්ම ප්‍රවෘත්තියකට නිශ්චිත බවක් පැවතිය යුතුය. ප්‍රවෘත්තිකරණයේදී මෙම මූලිකාංග ඇතැම් විට නිවැරදිව භාවිතා කරන බවක් පෙනෙන්නට ඇත. නමුත් බොහෝ අවස්ථාවල මෙම ප්‍රවෘත්ති මූලිකාංග භාවිතා කරන බවක් පෙනෙන්නට නැත. ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුමය.

## ගුවන් විදුලි ප්‍රවෘත්ති මූලධර්ම

**ගුවන් විදුලි** ප්‍රවෘත්ති වාර්තාකරණයේ නියැලෙන වාර්තාකරුවන් විසින් අනුගමනය කළ යුතු නිශ්චිත මූලධර්ම කිහිපයක් තිබේ. ප්‍රවෘත්ති කලා විෂයෙහි සාම්ප්‍රදායකි වශයෙන් පවතින මෙම මූලධර්ම කෙරෙහි නොතකා හැරීම හෝ ඉන් බැහැරව කටයුතු කිරීම ප්‍රවෘත්ති කලාවේ වැදගත් ආචාර ධර්ම බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් ලෙස සැළකේ.

**ගුවන් විදුලි** ප්‍රවෘත්ති ඇතුළු ප්‍රවෘත්ති කලාවේ මූලධර්ම අතර ප්‍රමුඛස්ථානය හිමි වන්නේ සත්‍යවාදී බවටයි. ඕනෑම ප්‍රවෘත්තියක් සත්‍යවාදී විය යුතුය. සත්‍යයෙන් තොරව ලියන ලද ප්‍රවෘත්තියක් මොනම හේතුවක් නිසාවත් ප්‍රවෘත්තියක් ලෙස නොසැලකේ. මන්ද ප්‍රවෘත්තියක තිබිය ප්‍රධානතම මූලධර්මය වන සත්‍ය එහි නොමැති බැවිනි. (ජගත්චන්ද්‍ර, 2003, පිටු : 30)

ප්‍රවෘත්තියක් පළ කිරීමට ප්‍රථම එහි සත්‍යතාව නිශ්චිත ලෙස සනාථ කර ගත යුතුය. අසත්‍ය ප්‍රවෘත්ති පළ කිරීම ජන සමාජයක් කැළඹීමටද සමාජ ගැටුම් ඇති වීමටද ජනවාර්ගික අර්බුධ ඇති වීමටද රාජ්‍ය තාන්ත්‍රික අමනාපකම් ඇතිවීමටද යනාදී භයානක ප්‍රතිඵල ගෙන දෙන්නක් විය හැකිය. එමෙන්ම එය පළකරනු ලබන මාධ්‍ය ආයතනය හා මාධ්‍යවේදීන් පිළිබඳව ජනතාව තබා ඇති විශ්වසනීයභාවය බිඳ වැටීමත් එමඟින් සිදුවේ.ජනමාධ්‍යයේ ආදර්ශ පාඨය වන්නේ Fact’s are Sacord, Comments are free’ යන්නයි. එනම් සත්‍ය උත්තරීතරයි. විවේචනය ස්වාධීනයි යන්නයි. එකී තේමා පාඨය උල්ලංඝනය වන ලෙස කටයුතු කළහොත් මාධ්‍යකරණයෙන් ජනතාව බලාපොරොත්තු වන සේවය ඉටු නොවන බව අමුතුවෙන් නොකිවමනාය. (රාජපක්ෂ, 2009, පිටු : 68) විද්‍යාව හා තාක්ෂණය දියුණු වුවත්, සන්නිවේදන ජාලය වඩාත් සක්‍රිය වුවත්, මාධ්‍යය ආයතනයක් විසින් එකම පුවත වෙනත් ආකාරයකින් පළකිරීම නිසාද මාධ්‍ය පිළිබඳ විශ්වාසය බිඳවැටීමක් සිදුවෙයි. මුල් කාලයේදී මාධ්‍ය යෙහි සඳහන් කරුණක් එපරිද්දෙන්ම සත්‍යයක් ලෙස විශ්වාස කිරීමට ජනතාව පෙළඹුනේය. එහි සත්‍යතාව තවදුරටත් තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවයක් ජනතාවට නොදැනුනි. අනෙක් අතට එසේ දැන ගැනීම පිණිස විකල්ප පණිවුඩ හුවමාරු ක්‍රමයද නොතිබුණි. නමුත් වර්තමානයේ ජංගම දුරකථනථ අන්තර්ජාල වැනි ක්‍රම දියුණු වී ඇති නිසා පුද්ගලයින් ප්‍රවෘත්තියේ සත්‍යතාවය තහවුරු කර ගැනීමට එකී විකල්ප ක්‍රම නිතැතින්ම යොදා ගනු ලැබේ. අනෙක් අතට විකාශය වූ හෝ පළ වූ ප්‍රවෘත්තියක සත්‍යතාව සෙවීමට පුද්ගලයින් උත්සාහ කිරීමෙන් ගම්‍ය වන්නේ මාධ්‍ය මඟින් පළ කරන පුවත් සම්බන්ධයෙන් මිනිසුන්ගේ විශ්වාසය වර්තමානයේදී හීන වී ඇත බවයි. ඒ අනුව සත්‍යවාදී බව හෙවත් නිරවැදි බව ප්‍රවෘත්තියක පැවතිය යුතු ප්‍රධානතම මූලධර්මය ලෙස සැළකේ.

**ගුවන් විදුලි** ප්‍රවෘත්ති ඇතුළු ප්‍රවෘත්ති වාර්තාකරණය තුළ සාකච්ඡා කරනු ලබන දෙවන මූලධර්මය වන්නේ සමබරබව හෙවත් මධ්‍යස්ථ බවයි. මෙමඟින් අපේක්ෂා කරනු ලබන්නේ සංදේශයේ පවතින සමතුලිතභාවයයි. (දිසානායක, 1999, පිටු : 19) එනම් අන්තර් ගතය අපක්ෂපාතීව ඉදිරිපත් කිරීමයි. විශේෂයෙන්ම ප්‍රවෘත්ති වාර්තාකරණයේදී අදාළ සිද්ධිය හා අවස්ථාවට දෙපැත්තක් තිබේ. එම නිසා එකී සිද්ධිය කවර තත්වයකට වුවද සමානව ඉදිරිපත් විය යුතුය.

විශේෂයෙන්ම ගැටුම්කාරී ප්‍රවෘත්ති තුළ සමබරබව නොතිබුනහොත් විවිධ අර්බුධ නිර්මාණය වේ. (සෙනෙවිරත්න, 2007, පිටු : 55) විශේෂයෙන්ම වාර්තාකරුගේ පෞද්ගලික හිතවත්කම් හෝ පක්ෂපාතීකම ඔහු අතින් ලියවෙන ප්‍රවෘත්තියට ඇතුලත් නොවිය යුතුය. (ජගත්චන්ද්‍ර, 2003, පිටු : 31) මෙම සමබරබව හෙවත් මධ්‍යස්ථභාවය අද ප්‍රවෘත්ති කලාවේ දක්නට ලැබෙන බලවත් ඌනතාවයකි. එක් එක් මාධ්‍ය ආයතන තමන්ට හා දේශපාලන පක්ෂ වලට අවශ්‍ය පරිදි ප්‍රවෘත්ති සම්පාදනය කිරීමට වර්තමානයේදී උත්සාහ දරයි. එය ප්‍රවෘත්ති පිළිබඳ වූ ජනතා විශ්වාසය ඌනවීම කෙරෙහිද ප්‍රබල ලෙස බලපානු ඇත. (ඩයස්, 2007, පිටු : 145) රාජ්‍ය මාධ්‍ය ආයතන රජයට අවශ්‍ය අන්දමට ප්‍රවෘත්ති වාර්තා කිරීමට උත්සාහ දරයි. විපක්ෂ මතයන් ජනතාව අතරට රැගෙන යාම සඳහා රාජ්‍ය මාධ්‍ය ආයතන කටයුතු නොකරන තරම්ය.

“සංක්ෂිප්ත බව” ද **ගුවන් විදුලි** ප්‍රවෘත්ති ඇතුළු ප්‍රවෘත්තිකරණය තුළ පැවතිය යුතු වැදගත් මූලධර්මයකි. ප්‍රවෘත්ති වාර් තාකරුවෙකු තමන් විසින් විස්තර කිරීමට යන සිදුවීම පිළිබඳව කොතෙකුත් කරුණු දැන සිටින්නට පුළුවන. එහෙත් ඔහු එය ග්‍රාහකයාට ඉදිරිපත් කළ යුත්තේ හැකිතාක් සංෂිප්තවය. තමන් දන්නා සියලුම දෑ ඊට ඇතුළත් කිරීමට ගියහොත් සිදු වන්නේ එය ප්‍රවෘත්තියක් නොව නීරස හැල්ලක් බවට පත් වීමයි. එහෙයින් තමන් විස්තර කිරීමට යන සිද්ධියේ වැදගත්ම කොටස ඉස්මතු වන අයුරින් ඉතා කෙටියෙන් සිය ප්‍රවෘත්තිය සකස් කිරීමට වාර්තාකරු උනන්දු විය යුතුය. (ජගත්චන්ද්‍ර, 2003, පිටු : 31)

පැහැදිලි බව හෙවත් නිරවුල් බවද අනාවාර්යයෙන්ම පැවතිය යුතු ප්‍රවෘත්ති මූලධර්මයකි. මෙම සංකල්පය ප්‍රවෘත්තියක අන්තර්ගතයට, ඉදිරිපත් කිරීමට සේම භාෂාව හා ආකෘතිය කෙරෙහිද බලපායි. කිසියම් වාර්තාවක් හෝ සංදේශයක් ඉදිරිපත් කරන්නේ සාමානය ජනතාවටය. එම නිසා පැහැදිලි බවේ අවශ්‍යතාවය වඩාත් ඉස්මතු වන්නේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය යන්හිදීය. රූපවාහිනි හා ගුවන්විදුලි මාධ්‍යවල සංදේශ වලදී ග්‍රාහකයකු ඒ හා සම්බන්ධ වන්නේ ඉතා කෙටි වේලාවක්ය. එම පණිවුඩය ග්‍රහණය කර ගැනීමට ඔහුට ලැබෙන්නේ එක් වරකි. මේ තත්වය මත විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්තිකරණයේදී පැහැදිලි බව අත්‍යාවශ්‍ය සාධකයකි. (සෙනෙවිරත්න, 2007, පිටු : 56) විශේෂයෙන් ප්‍රවෘත්ති වාර්තාකරුවෙකු විසින් මුලින්ම කළ යුත්තේ තමන් විසින් ලියන ලද ප්‍රවෘත්තිය තමන් විසින්ම කියවා බැලීමයි. එවිට එහි අපැහැදිලි තැන් ඇත්නම් කල් ඇතිව හඳුනා ගැනීම සඳහා අවස්ථාව උදාවේ. තමන් ලියූ දෑ තමන්ටම නොවැටහෙන්නේ නම් අනුන්ට වටහා ගැනීම අතිශය දුෂ්කර බව ප්‍රවෘත්ති වාර්තාකරුවන් අවබෝධ කර ගත යුතුය. (ජගත්චන්ද්‍ර, 2003, පිටු : 31)

විශ්වසනීයත්වය තහවුරු කිරීමද ප්‍රවෘත්තිකරණයේදී අතිශයින් වැදගත් වේ. මෙය ප්‍රවෘත්ති මූලධර්මයන් ලෙසද ක්‍රියාත්මක වේ. ජනමාධ්‍ය අධ්‍යයනයේදී වඩාත් අවධානය යොමු විය යුත්තේ මාධ්‍ය විශ්වසනීයත්වය කෙරෙහිය. විශ්වසනීයත්වය මාධ්‍යයේ මෙන්ම මාධ්‍යකරුවාගේ පැවැත්ම කෙරෙහිද ඍජුව බලපායි. (සෙනෙවිරත්න, 2007, පිටු : 56) මාධ්‍ය විචාරකයින් දක්වන ආකාරයට මාධ්‍යයේදී අත්‍යාවශ්‍ය වූත් ගොඩනගා ගැනීමට අපහසු වූත් සංකල්පය ලෙස සැළකෙන්නේ විශ්වසනීයත්වයයි. ප්‍රවෘත්තිකරණයේදී අනිවාර්යයෙන්ම පැවතිය යුතු නිවැරදි බව සමබර හා නිරවුල් බව විශ්වසනීයත්වය ගොඩනගා ගැනීම කෙරෙහි බලපායි. එම නිසා නිවැරදි හා වඩාත් වගකියන මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීමටද විශ්වසනීයත්වය ඉවහල් වේ. මේ අනුව ප්‍රධාන වශයෙන් සත්‍යවාදී බව, සමබර

බව, පැහැදිලි බව, සංක්ෂිප්ත බව හා විශ්වසනීයත්වය යන සාධක ප්‍රවෘත්තිකරණයේදී මූලධර්ම වශයෙන් ක්‍රියාත්මක වන බව පැහැදිලිය.

## ගුවන් විදුලි ප්‍රවෘත්ති මූලාශ්‍ර

ඕනෑම දෙයක් ඇතිවීම කෙරෙහි යම් පදනමක් පැවතිය යුතුය. එසේම **ගුවන් විදුලි** ප්‍රවෘත්ති ඇතුළු යම් ප්‍රවෘත්තියක් බිහිවීම සඳහාද මූලාශ්‍රයක් පැවතිය යුතුය. මන්දයත් ප්‍රවෘත්තිකරණයේ මූලික පදනම රැඳී පවතින්නේ මූලාශ්‍ර මතය. මූලාශ්‍ර සමග හොඳින් සම්බන්ධතා ගොඩනගා ගන්නා හා ඒවා නඩත්තු කරන විශේෂයෙන් වාර්තාකරු මේ ක්ෂේත්‍රයේ සාර්ථක වෙති. (කුමාර,2008, පිටු: 48) ප්‍රවෘත්තිකරණයේ සියලු දෑ මූලාශ්‍රමත රඳා පවතී. මාධ්‍ය ආයතන තමා වෙත ප්‍රවෘත්ති සපයා ගැනීම සඳහා විවිධ මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කරයි. (ඩයස්, 2007, පිටු : 147) වෘත්තිය ප්‍රවෘත්ති වාර්තාකරුවන්ට මූලාශ්‍ර ලෙස හඳුනා ගත හැකි අංග රැසක් පහත පරිදි දැක්විය හැකිය.

- මාණ්ඩලික වාර්තාකරුවන්
- පුද්ගල සම්බන්ධතා මගින්
- ප්‍රවෘත්ති නිවේදන
- දුරකථන මගින් විමසීම් කිරීමෙන්
- ලිපි ලේඛන හා දත්ත සටහන් ආදිය මගින්
- විවිධ පුද්ගලයින් ලියා එවන විස්තර මගින්
- තමා විසින්ම සිදු කරන සංචාර හා ගවේෂණ මගින්
- විවිධ ස්ථාන පිළිබඳව සැලකිලිමත් වීමෙන් (පාර්ලිමේන්තුව, පොලීසිය ආරක්ෂක අංශ වැනි)
- විවිධ සංවිධාන, සමාගම් හා මණ්ඩල
- අන්තර්ජාලය
- අන්තර්ජාතික ප්‍රවෘත්ති ආයතන
- ප්‍රාදේශීය ප්‍රවෘත්ති ආයතන

නූතනයේ දක්වට ලැබෙන ප්‍රධානතම ප්‍රවෘත්ති මූලාශ්‍රය ලෙස “මාණ්ඩලික වාර්තාකරණය” හැඳින්විය හැක. ප්‍රවෘත්ති අංශය තුලම කටයුතු කරමින් ප්‍රවෘත්ති වාර්තාකරණයේ යෙදෙමින් ඔවුන් කටයුතු කරයි. තම ප්‍රවෘත්ති අංශය අවට සිදුවන ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති සිදුවීම වාර්තාකරණය කිරීම මාණ්ඩලික වාර්තාකරුවන් අතින් සිදුවේ. විශේෂයෙන්ම ප්‍රවෘත්ති සාකච්ජාවන් වලට සහභාගීවන්නේ ද මාණ්ඩලික වාර්තාකරුවන් වේ. ඊට අමතරව පාර්ලිමේන්තු වාර්තාකරණයේ නිරතවන්නේද මාණ්ඩලික වාර්තාකරුවන්ය. එනම් මාණ්ඩලික වාර්තාකරුවන් හරහා ප්‍රවෘත්ති අංශයට විශාල කාර්යභාරයක් ඉටුවේ. ඔවුන් සජීවී විස්තර කරණයේද නිරත වේ. ඒ හරහා ප්‍රවෘත්තියට වැඩි වටිනාකමක් එකතු කර ගැනීමටද හැකියාව ලැබේ.

පුද්ගල සම්බන්ධතා ප්‍රධාන ප්‍රවෘත්ති මූලාශ්‍රයක් ලෙස ක්‍රියාත්මක වේ. ඉහත සඳහන් ප්‍රදාන ප්‍රවෘත්ති සම්පාදන මාර්ග අතුරින් ලිපි ලේඛන හා දත්ත සටහන් හැර අනෙකුත් සියළුම මාර්ග වලින් දත්ත ලබාගත හැක්කේ විවිධ පුද්ගලයන් සමග ගොඩනගා ගන්නා ලද සබඳතා ආදියෙනි. හැම ප්‍රවෘත්ති වාර්තාකරුවෙකුටම ඉතා හොද මහජන සම්බන්ධතා ජාලයක් පැවතීම අත්‍යාවශ්‍ය වෙයි. (ජගත්චන්ද්‍ර, 2008, පිටු : 57) තම දෛනික කටයුතු වලට අවශ්‍ය කෙරෙන එම මහජන සම්බන්ධතාව ජාලය සාර්ථකව පවත්වාගෙන යන කිසිදු වාර්තාකරුවෙකුට කොයිම අවස්ථාවකදී වුවද ප්‍රවෘත්ති හිගයක් ඇති නොවේ.

පුවත්පතක් සාකච්ඡා, රැස්වීම් හා වැඩමුලු මගින්ද ප්‍රවෘත්ති සඳහාද අවශ්‍ය තොරතුරු ලැබේ. විශේෂ ආයතන හා විශේෂ පුද්ගලයන් මගින් සංවිධානය කරනු ලබන මෙම අවස්ථාවලින් කෙරෙහි ප්‍රකාශ හා සිදුවීම්වල ප්‍රවෘත්ති අගයක් ඇති තොරතුරු බොහෝ විය හැකිය. බොහෝ විට පුවත්පත් සාකච්ඡා කැඳවනු ලබන්නේ එවැනි විශේෂිත සිදුවීම් හෝ තොරතුරු මාධ්‍ය වෙත දැනුම්දීම සඳහාය. (ඩයස්, 2007, පිටු : 147) විශේෂයෙන් සතියකට වරක් අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම සඳහා රජය විසින් විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡාවක් කැඳවනු ලබයි. එය එදිනට බොහෝ ප්‍රවෘත්ති අංශයන් තුළ ප්‍රමුඛ පුවත බවට පත් වෙයි. එසේම විවිධ දේශපාලන පක්ෂ හා කණ්ඩායම් විසින්ද ප්‍රවෘත්ති සාකච්ඡා කැඳවනු ලබයි. අනෙක් අතින් රැස්වීම් ද ප්‍රධාන ප්‍රවෘත්ති මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියාත්මක වේ. උදාහරණයක් වශයෙන් ජනාධිපතිවරයා හා විපක්ෂ නායකවරයා සහභාගීවන රැස්වීම් දැක්විය හැකිය. එම රැස්වීම් වලදී ප්‍රකාශ කරන ඇතැම් ප්‍රකාශ දවසේ පුවත බවට පත්වෙයි.

දුරකථනයෙන් විමසීම මගින්ස ප්‍රවෘත්ති ලබා ගැනීම සිදුවේ. රාජ්‍ය නායකයන්ගේ ඉදිරි වැඩපිළිවෙලවල්, පොලීසිය ආශ්‍රිත සිදුවීම්, අමාත්‍යාංශ ආශ්‍රිත සිදුවීම්, විශේෂිත පුද්ගලයන් ආශ්‍රිත සිදුවීම්, ප්‍රවෘත්ති බවට පත් කල හැකි තොරතුරුය. මෙම තොරතුරු බෙහෝ අවස්ථාවලදී වාර්තාකරුවන් ලබා ගන්නේ දුරකථනය මගිනි.

ලිපිලේඛන, දත්ත සටහන් ආදියද ප්‍රධාන ප්‍රවෘත්ති මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියාත්මක වේ. මේ යටතට ප්‍රවෘත්ති නිවේදන, පළ වූ වාර්තා, නිල වාර්තා ආදය අදාල වේ. (කුමාර, 2008, පිටු : 61) බොහෝ අවස්ථාවලදී ප්‍රවෘත්ති ආයතනයකට ලැබෙන ප්‍රවෘත්ති නිවේදනය ප්‍රධාන ප්‍රවෘත්තියක් බවට පත්වන අවස්ථා දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් හෙජින් ගිවිසුම සම්බන්ධයෙන් ඛණිජ තෙල් අමාත්‍යවරයා නිකුත් කරන ලද ප්‍රවෘත්ති නිවේදනය දැක්විය හැකිය. බොහෝ විට එම නිවේදනයේ සඳහන් කරුණු ප්‍රමුඛ පෙළේ ප්‍රවෘත්තියක් බවට පත්වීමට ඉඩ ඇත. බොහෝ වාර්තාකරුවන් ප්‍රවෘත්ති සම්පාදනය කිරීමේදී පුස්තකාලීය මූලාශ්‍ර සහ නීතිය පිළිබඳ මූලාශ්‍ර භාවිතා කරයි. (කාරියවසම්, 1993, පිටු : 40) එමෙන්ම විවිධ පුද්ගලයන් ලියා එවන විස්තර මගින්ද හරවත් ප්‍රවෘත්තියක් සම්පාදනය කර ගැනීමට අවස්ථාවක් උදාවිය හැකිය. ඔවුන් ලියා එවන ලද තොරතුරක වැදගත් ප්‍රවෘත්තියකට අදාල හෝඩුවාවක් තිබිය හැකිය. එම තොරතුරු හඹා ගොස් ඒ තුල ඇති ප්‍රවෘත්ති හඳුනා ගැනීම දක්ෂ වාර්තාකරුවෙකුගේ ලක්ෂණයකි.

ප්‍රවෘත්ති වාර්තාකරු විසින්ම සිදුකරන සංචාර හා ගවේෂණ මගින්ද ඉතා වැදගත් ප්‍රවෘත්ති ලබා ගැනීමට අවස්ථාව උදාවේ. එනම් මෙය ඉතා වැදගත් ප්‍රවෘත්ති මූලාශ්‍රයකි. බොහෝ අවස්ථාවලදී මාණ්ඩලික වාර්තාකරුවන් යම් යම් කරුණු සම්බන්දයෙන් ගවේෂණ සිදු කරති. ඔවුහු යම් යම් ප්‍රදේශවල සංචාරය කරති. ඒ හරහා ආයතනයට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට උත්සාහ කරයි. මෙය රූපවාහිනි, ගුවන්විදුලි, පුවත්පත් යන සෑම මාධ්‍ය ආයතනයක ප්‍රබලම ලෙස භාවිතා කරන මූලාශ්‍රයකි. (කුරුප්පු, 1991, පිටු : 21)

විවිධ ස්ථාන පිළිබඳව විමසිලිමත් වීමෙන්ද වාර්තාකරුවන් ප්‍රවෘත්ති ලබා ගනී. උදාහරණ වශයෙන් පාර්ලිමේන්තුව, ගුවන්තොටුපල, පූණ්‍යායතනළ පල්ලි, පොලීසිය, පාසල් වැනි ස්ථාන දැක්විය හැකිය. (කුමාර, 2008, පිටු : 63) මෙම ස්ථාන වල ප්‍රවෘත්ති බිහිවන බව ප්‍රත්‍යක්ෂයෙන්ම දන්නා කරුණකි. ප්‍රධාන වශයෙන් පොලීසිය ප්‍රවෘත්ති ලබා දෙන මූලාශ්‍රයක වශයෙන් ක්‍රියාත්මක වේ. රිය අනතුරු, මංකොල්ල කෑම්, මිනී මැරුම්, වැනි සිද්ධීන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට සිදු වන්නේ පොලීසිය මගිනි. මේ අනුව ගම්‍ය වන්නේ විවිධ ස්ථාන පිළිබඳව සැලකිලිමත්වීම හරහා ප්‍රවෘත්ති වාර්තාකරණයට අදාල තොරතුරු ලබා ගත හැකි බවයි.

අන්තර්ජාලයද ප්‍රවෘත්ති සපයා ගැනීම සඳහා ඉතා හොඳ මූලාශ්‍රයකි. මෙහිදී නිල වෙබ් අඩවි පිළිබඳව විශ්වාසයක් ඇති වීම බෙහෙවින්ම වැදගත් වේ. සාමාන්‍යායෙන් වෙබ් අඩවියක් නිර්මාණය කර ගැනීම හා අන්තර් ජාලයට එක් කිරීම එතරම් අපහසු කාර් යයක් නොවේ. එබැවින් සාව දා තොරතුරු රැගත් වෙබ් අඩවි අන්තර් ජාලයේ දක්නට ලැබේ. එසේම විවිධ නියෝජිත ආයතනවල වෙබ් අඩවිද

අන්තර් ජාලයේ ඇත. ඒවා මගින්ද ප්‍රවෘත්ති සපයා ගැනීමට පුළුවන. (වීරකෝන්, 2006, පිටු : 34) උදාහරණයක් වශයෙන් www.news.lk යන වෙබ් අඩවිය දැක්විය හැකිය. මෙය රජ යේ නිල පුවත් වෙබ් අඩවිය වශයෙන් ක්‍රියාත්මක වේ. මේ හරහා රජය හා සම්බන්ධ වැදගත් තොරතුරු ලබා ගැනීමට අවස්ථාව උදාවේ.

ප්‍රාදේශීය වාර්තාකරුවන්ද ප්‍රධාන ප්‍රවෘත්ති මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියාත්මක වේ. රට වටා සිදුවන දේ මාධ්‍ය ආයතන වෙත ලබා ගත හැකි වන්නේ ඔවුන් හරහාය. උදාහරණයක් වශයෙන් හම්බන්තොට ප්‍ර දේශයේ සිදුවූ රිය අනතුරක් දැක්විය හැකිය. එම අනතුර පිළිබඳව වූ රූපරාමු මාධ්‍ය ආයතනයට ලබා ගත හැකි වන්නේ ප්‍රා දේශීය වාර්තාකරුවන් හරහාය. ඒ අනුව පෙනී යන්නේ ප්‍රා දේශීය වාර් තාකරුවන් ද ප්‍රවෘත්ති මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියාත්මක වන බවයි. අන්තර් ජාතික ප්‍රවෘත්ති ආයතනද ප්‍රධාන ප්‍රවෘත්ති මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියාත්මක වේ. අන්තර් ජාතික ප්‍රවෘත්ති ලබා ගැනීමේදී ප්‍රමුඛතාව රඳා පවතින්නේ ප්‍රධාන ප්‍රවෘත්ති ඒජන්ත වෙතය. BIG 4 ලෙස හඳුන්වන ප්‍රධාන ආයතන හතරක් අන්තර් ජාතික ප්‍රවෘත්ති බෙදා හැරීම සම්බන්ධව වැඩි වගකීමක් දරයි.

1. ලන්ඩනයේ රොයිටර් (REUTERS)
2. ඇමරිකාවේ යුනයිටඩ් ප්‍රෙස් ඉන්ටර් නැෂනල් (UNITED PRESS INTERNATIONL)
3. ඇමරිකාවේ ඇසෝසියෙටඩ් ප්‍රෙස් (ASSOCIATED PRESS)
4. ප්‍රංශයේ AFP

මෙම බලවත් ප්‍රවෘත්ති ආයතන විසින් බෙදා හරින ප්‍රවෘත්ති අප රටවල් සම්බන්ධයෙන් කොතරම් වැදගත්ද යන්න අවධානය යොමු කළ යුතු කරුණකි. මෙවන් බටහිර රටවල ඒකාධිකාර දූතයන් ලෙසද හැඳින්විය හැකිය. (කාරියවසම්, 1993, පිටු : 04)

ප්‍රධාන ප්‍රවෘත්ති ආයතන 04ට අමතරව බලවත් රාජ්‍යයන්ට අයත් ප්‍රවෘත්ති ඒජන්සි තිබේ. බ්‍රිතාන්‍යයේ බී.බී.සී.ආයතනය, ලොව ප්‍රකට සී.එන්.එන්.සේවය උදාහරණ වශයෙන් දැක්විය හැකිය. පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල ප්‍රවෘත්ති බෙදා හැරීමේදී බී.බී.සී. ආයතනයේ ක්‍රියාකාරීත්වයට සමීපභාවයක් තිබේ. (වලේබොඩ, 2010, පිටු : 62)

මාධ්‍ය ආයතනයකට විවිධ ක්‍රම ඔස්සේ ප්‍රවෘත්ති ලැබෙන බව මේ අනුව ගම්‍යමාන වේ. ප්‍රවෘත්ති අංශයට ලැබෙන මෙම තොරතුරු වල විශ්වාසවන්භාවය පිළිබඳව මූලික වශයෙන් අවධානය යොමු කළ යුතුය. එසේ නොමැති නම් ප්‍රවෘත්තිවල ගුණාත්මකභාවය පිළිබඳව ගැටලු ඇති වේ. මාධ්‍ය ආයතනයකට ප්‍රවෘත්ති ලැබෙන ක්‍රම පිළිබඳව ඉහත පරිදි කරුණු විග්‍රහ කළ හැකිය.

## ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රවෘත්ති වර්ග

ප්‍රවෘත්ති යන්න විවිධ අයුරින් වර්ගීකරණයකට ලක් කර ඇත. ඉදිරිපත් කරන ප්‍රවෘත්තියේ ආකෘතිය, අන්තර් ගතයයේ ස්වභාවය හා යොදා ගන්නා කාලය අනුව ප්‍රවෘත්ති ප්‍ර භේද ගත කළ හැකිය. ප්‍රධාන වශයෙන් නූතන ප්‍රවෘත්ති වර් ගීකරණයේදී ප්‍ර භේද තුනක් දක්නට ලැබේ. (සෙනෙවිරත්න, 2007, පිටු : 14)

1. දෘඩ ප්‍රවෘත්ති (Hard News)
2. මෘදු ප්‍රවෘත්ති (Soft News)
3. ගවේෂණාත්මක ප්‍රවෘත්ති (Investigative News)

නූතන ප්‍රවෘත්ති වර්ගීකරණය තුළ සාකච්ඡා කෙරෙන ප්‍රධානතම ප්‍රවෘත්ති ප්‍ර භේදයක් ලෙස දෘඩ ප්‍රවෘත්ති දැක්විය හැකිය. මෙම ප්‍රවෘත්ති සකසන්නේ කවුද, කවදාද, කොතැනකද, කුමක් නිසාද, කවර ආකාරයකටද, ආදී ප්‍රශ්න වලට පිළිතුරු ලැබෙන පරිදිය. මෙම ප්‍රවෘත්ති විස්තර කිරීමට යුධ පුවත්, අපරාධ, දේශපාලනමය හා ආර් ථිකමය පුවත් යොදා ගනු ලබයි. මෘදු ප්‍රවෘත්ති යනු සෑම විටම දෘඩ ප්‍රවෘත්තියක පිටුපසින් සිටින මිනිසුන් සම්බන්ධ මානව ප්‍රවෘත්තියකිත මෙම මෘදු ප්‍රවෘත්ති මිනිසුන් මූලා කරන සුලු යැයි පිළිගැනීමක් තිබේ. මෙම ප්‍රවෘත්ති වලට මහජන සුබ සිද්ධියට අදාල තොරතුරු, සතුන්, පාරිසරික පුවත් හා වෙනත් ඕනෑම විෂයක් යටතේ ලියවෙන කෙටි පුවත් මහජනයාට එතරම් වැදගත්කමක් නොමැතිවූත් තොරතුරු ඇතුලත් වේ. විශේෂයෙන් මෘදු ප්‍රවෘත්තියක අගය රඳා පවත්වා ගැනීමට මානව භාව සංවේදී අවස්ථා හා සිද්ධි යොදා ගනු ලැබේ.

ප්‍රවෘත්ති වාර්තාකරණයේදී ගවේෂණාත්මක ප්‍රවෘත්තිවලටද ඉතා සුවිශේෂී තැනක් හිමිවේ. ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර් තාකරණයේදී එදිනෙදා ප්‍රවෘත්තිද සම්බන්ධ වේ. නමුත් ඒ සඳහා අමතර කාලයක් හා වියදමක් දැරීමට සිදුවේ. ඇමරිකාවේ වෝටර් ගේට් සිද්ධිය මේ සම්බන්ධව තිබෙන ප්‍රධානතම උදාහරණයයි. එය සාමාන්‍ය වාර් තාකරණය තුලදී අනාවරණය නොවුනි. ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර් තාකරුවන් විසින් සමාජ ක්‍රම, ආර් ථික ක්‍රම, දේශපාලනික ක්‍රියා මෙන්ම දූෂණ හා අල්ලස් වංචා පිළිපඳව ගැඹුරින් අධ්‍යයනය කරනු ලබයි. (සෙනෙවිරත්න, 2007, පිටු : 17) ගවේෂණාත්මක ප්‍රවෘත්ති පිළිබඳව සැන් ප්‍රැන්සිස්කෝ සරසවියේ පුවත්පත් කලාව පිළිබඳව මහාචාර්යවරයෙකු වූ ලෙනාර්ඩ් සෙලර්ස් (Leanad Zellers) විසින් පහත පරිදි සරල නිර් වචනයක් සපයයි.

“ගවේෂණාත්මක වාර් තාකරණය යනු සදාචාරාත්මක හෝ නෛතික සම්මතයන් කඩ කිරීම් වසන් කිරීම සඳහා හිතා මතාම සඟවා ඇති තොරතුරු සොයා බලා අනාවරණය කිරීමයි”. (ගුණසිංහ, 1998, පිටු : 31)

ශ්‍රී ලංකාවේ ගවේෂණාත්මක මාධ්‍ය වාර්තාකරණය හරහා මෑත කාලයක් වන තෙක් කිසිදු සේවාවක් සිදුවූවා යැයි කීම අපහසුය. රිචඩ් ද සොයිසා මාධ්‍ය වේදියා ඝාතනය පසුපස කොතෙකුත් දේශපාලන අදිසි හස්තයක් පැවැති බවට පොදුවේ කරුණු වාර් තාකරණය කරනු ලැබුවද ඒ පිළිබඳව වූ යටගියාව සත්‍ය ලෙසින් සොයා ගැනීමට එම මාධ්‍ය වේදීන්ට හැකියාවක් නොලැබුණි. නමුත් පෞද්ගලික මාධ්‍ය ආයතන සමහරක් ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාරතා කිරීම සඳහා යම් උත්සාහයක් දරන බව පෙනේ. (රාජපක්ෂ, 2009, පිටු : 110) කෙසේ වෙතත් මාධ්‍ය ක්ෂේත්‍රෙය් විශාල වපසරියක් භාෂා මාධ්‍ය මගින් මෙහෙය වනු ලබන රටක ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර් තාකරණය ඉහළ මට්ටමකට ගෙන ඒම ප්‍රාෙය්ගික ලෙස අපහසු බව පිළිගත යුතු කරුණකි.

ඉහත ප්‍රවෘත්ති වර්ගීකරණයට අමතරව පහත අයුරින්ද ප්‍රවෘත්ති වර්ගීකරණය කර ඇත. ඒ ඉතා සරල ප්‍රවෘත්ති වර් ගීකරණයයි. එනම් ඕනෑම රටක මාධ්‍යයක පළවන ප්‍රවෘත්ති හඳුනා ගැනීම සඳහා එම වර් ගීකරණය අනුගමනය කිරීම ඉතා පහසු වේ. (සෙනෙවිරත්න, 2007, පිටු : 20)

- දේශපාලන ප්‍රවෘත්ති
- ආර්ථික ප්‍රවෘත්ති
- සංවර්ධන ප්‍රවෘත්ති
- සංස්කෘතික ප්‍රවෘත්ති
- ක්‍රීඩා ප්‍රවෘත්ති
- විදෙස් ප්‍රවෘත්ති
- පාරිසරික ප්‍රවෘත්ති

- අපරාධ ප්‍රවෘත්ති
- කාලගුණ ප්‍රවෘත්ති
- ගැටුම් සම්බන්ධ වූ ප්‍රවෘත්ති
- විෂයපාදක ප්‍රවෘත්ති
- භූගෝලී කලාපය පදනම් කරගත් ප්‍රවෘත්ති
- අසාමාන්‍ය ප්‍රවෘත්ති

" දේශපාලන ප්‍රවෘත්ති ඉතා වැදගත් ප්‍රවෘත්ති ප්‍ර භේදයකි. ප්‍රවෘත්ති විකාශයන් තුළින් දේශපාලන තොරතුරු වාර් තා කිරීම ඉතා වැදගත් වන්නේ රටක දේශපාලනමය වශයෙන් සිදුවුණු දෑ සහ සිදුවීමට නියමිත දෑ ජනතාවගේ එදිනෙදා ජීවිතයට මහත් බලපෑමක් කරන නිසාය. පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ජනතාව දේශපාලකයන් පිළිපදව දරන ආකල්පය සුබවාදී නොවීය. දේශපාලකයා යනු බඩගෝස්තරවාදීයෙකු බවත් ආත්ම ලාභය සඳහාම පමණක් කටයුතු කරන්නෙකු බවත් පොදුවේ මාධ්‍ය මගින් හුවා දැක්වීමට උත්සාහ කරයි. (රාජපක්ෂ, 2009, පිටු : 155) සිංහල මුද්‍රිත මාධ්‍යයේ කාටූන් චිත්‍ර මගින් දේශපාලකයා වැඩි වශයෙන් හඳුන්වනු ලබන්නේ මගෝඩිස්තුමා වශයෙනි. මාධ්‍ය කරුවාගේ වගකීම හුදෙක් එය තුළින් තවත් දේශපාලන ප්‍රහසනයක් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට වඩා ඒ සමඟ දේශපාලඥයා නිවැරදි විය යුත්තේ කුමන ආකාරයකටද යන්න පිළිබඳව කරුණු හෙළිදරව් කිරීමද වේ. එමෙන්ම සියලුම දේශපාලකයන්ට එකම හැන්දෙන් බෙදීමේ ක්‍රියාවලිය සුදුසු නැත. අවංක හා සත්‍යවාදී දේශපාලකයන් සිටීනම් ඔවුන් වෙනම හඳුනා ගෙන කටයුතු කිරීම වඩාත් උචිත වේ. අද වන විට ඕනෑම ප්‍රවෘත්ති විකාශයක බහුතර කාල වේලාවක් වැය කරන්නේ දේශපාලන ප්‍රවෘත්ති සඳහාය. ප්‍රවෘත්ති විකාශ හරහා පක්ෂ විපක්ෂ දේශපාලන මතවාද ජනතාව අතරට රැගෙන යයි. ඒ සඳහා වූ වෙනමම ප්‍රවෘත්ති විශේෂාංගද නිෂ්පාදනය කිරීමට ඇතැම් නාලිකා වර් තමානයේදී කටයුතු කරනු ලබයි.

සංවර්ධන ප්‍රවෘත්ති සඳහාද ප්‍රවෘත්ති වාර්තාකරණයේදී විශේෂ තැනක් හිමිවේ. ආර් ථික අංශයන්ගෙන් රට තුළ සිදුවන සංවර්ධනය ජනතාව අතරටරැගෙන යාම සඳහා මෙහිදී ප්‍රධාන වශයෙන් කටයුතු කරනු ලබයි. (වලේබොඩ, 2010, පිටු : 75) උදාහරණයක් වශයෙන් වත්මන් රජයේ ගම නැගුම, මඟ නැගුම, දිවි නැගුම වැනි සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳව තොරතුරු ප්‍රවෘත්ති විකාශයන් තුළදී ඉදිරිපත් කරනු ලබන අන්දම දැක්විය හැකිය. පෞද්ගලික මාධ්‍ය ආයතන වලට වඩා රාජ්‍ය මාධ්‍ය ආයතන ඉතා වැඩි වශයෙන් සංවර්ධධන පුවත් වාර් තා කිරීම සඳහා උත්සුක වන බව පෙනෙන්නට තිබේ.

සංස්කෘතික ප්‍රවෘත්තිද ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රභේදයකි. සමාජය තුළ පවතින ආගමික සමාජීය හා ආධ්‍යාත්මික කරුණු කාරණා මේ යටතේ විවරණයවේ. (ගුණසේකර, 1998, පිටු : 14) බොහෝ අවස්ථාවලදී පුවත්පත් මාධ්‍යවල සංස්කෘතික ප්‍රවෘත්ති සඳහා වැඩි අවස්ථාවක් ලබා දෙයි. පවතින පාරිසරික ගැටලු පරිසර සංරක්ෂණ ව්‍යාපෘති ආදිය පිළිබඳව ප්‍රවෘත්ති වාර් තාකරණය කරන්නට පුවත්පත් මාධ්‍යය මෙන් විද්‍යුත් මාධ්‍යයද උත්සුක වී ඇති බව පෙනෙන්නට තිබේ.

ක්‍රීඩා පුවත් වාර්තාකරණයද ප්‍රවෘත්තිකරණයේදී ඉතා වැදගත් අංශයකි. ලෝකයේ ග්‍රාහකයන්ගෙන් වැඩි දෙනා රුචිකත්වයක් දක්වන්නේ ක්‍රීඩා ප්‍රවෘත්ති පිළිබඳවය. මාධ්‍ය ආයතන වල සෙල්ලම් බඩු අලෙවි කරන අංශය, ක්‍රීඩා අවාරණ යැයි මතයක් ඇත. ක්‍රීඩා වාර්තාකරණයෙහි පිළිගත් යෙදුම්ද තිබේ. (Sports Writing Cliohes) ඒවා සමහර විටක අර්ථ විරහිතය. දැන් මේ යෙදුම් යටපත් වී අලුත් තත්වයක් මතුවී ඇත. ලිවීම පිළිබඳ නව ශෛලි මතුවී තිබේ. පාසල්, විද්‍යාල, ක්‍රීඩා සමාජ ආවරණ මෙන්ම ක්‍රීඩකයින් හා ක්‍රීඩා පුහුණු කරවන්නන් හා සමග කරන සාකච්ජාද ක්‍රීඩා ප්‍රවෘත්ති වලට ඇතුළත් කර ගත හැකිය. (කාරියවසම්, 1993, පිටු : 87) එමෙන්ම ක්‍රීඩා ගැන උනන්දුවක් නැත්නම් ක්‍රීඩා ආවරණ කළ නොහැකිය. ක්‍රීඩකයන් ගැන විස්තර මෙන්ම ලෝකයේ ඒ ක්‍රීඩාව පිළිබඳවද විස්තර දැන ගත යුතුය. ලොව වෙනත් රටවල ක්‍රීඩකයා විකිණිය හැකි භාණ්ඩයකි. ඉතා දක්ෂ ක්‍රීඩකයන් ලබා ගැනීම සඳහා ක්‍රීඩා සමාජ පවුම් ලක්ෂ ගණන් ගෙවති. ඔවුන් ග්‍රාහකයන්ගේ පමණක් නොව රටේද, ලෝකයේද,

වීරයන් බවට පත්වෙති. වර්තමානයේ බොහෝ මාධ්‍ය ආයතන වල ක්‍රීඩා පුවත් වාර් තාකරුවන්ගේ හුදෙක් තරඟ ප්‍රතිඵල පමණක් ලබා ගැනීම අපේක්ෂා නොකෙරේ. තරඟය නැරඹීමෙන් ග්‍රහණය කර ගත නොහැකි යමක් සැපයීම ඔහුගේ ඉලක්කය විය යුතුය. තරඟය දෙස විවිධ දෘෂ්ටිකෝණ ඔස්සේ බලමින් එය විශ්ලේෂණාත්මක ලෙස දක්වා සිටීමට වාර් තාකරුවා සමත් විය යුතුය. ප්‍රධාන වශයෙන් ක්‍රීඩා පුවත් වාර් තාකරණයේදී එම ක්‍රීඩාවට විශේෂ වූ තාක්ෂණික වචන අවම වශයෙන් යොදා ගෙන සාමාන්‍ය ග්‍රාහකයාටද තේරුම් ගත හැකි වන පරිදි පහසු ශෛලියකින් ප්‍රවෘත්ති වාර් තා කල යුතුය. එසේම ක්‍රීඩා පුවත් වාර් තාකරණයේදී සොයා බැලිය යුතු කරුණු කීපයකි. (කුමාර, 2008, පිටු : 113)

- වාර්තාකරන මොහොත වන විට තරගයේ ලකුණු ප්‍රමාණය හෝ ප්‍රතිඵල
- තරගයට හෝ තරඟාවලියට අදාල කණ්ඩායම් හා ක්‍රීඩකයන්ගේ නම්
- තරඟය පැවැත්වෙන්නේ කුමන වේලාවකදීද යන්න
- කුමන ස්ථානයකදී එය පැවැත්වේද යන්න
- ප්‍රධාන තරඟකරුවන් කවුද
- තරඟය නැරඹීමට පැමිණි ප්‍රේක්ෂක සංඛ්‍යාව පිළිබඳ විස්තර
- ක්‍රීඩකයන්, පුහුණුකරුවන් හා ආධාරකරුවන්ගෙන් ලබා ගත් අදහස්
- තරඟ අතරතුරදී සිදුවූ අනතුරු
- තරඟයක් අතරතුරදී සටහන් කිරීමට හැකිවූ අලුත් තරග වාර්තා
- තරගයේ සිදුවිය හැකි අසාමාන්‍ය ක්‍රියා
- කාලගුණ තත්වය

ආදිය පිළිබඳව ක්‍රීඩා පුවත් වාර් තාකරණයේදී විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

අපරාධ සම්බන්ධ ප්‍රවෘත්ති වලට ප්‍රවෘත්තිකරණයේදී වැදගත් ස්ථානයක් හිමි වෙයි. අපරාද සම්බන්ධ ප්‍රවෘත්ති ලෙස සැලකෙන්නේ ලෝකයේ නන් දෙසින් අපරාධ, අපරාධකරුවන් පිළිපබඳව ඒ සඳහාවන දඬුවම් වැනි සිද්ධි වලට අදාල ප්‍රවෘත්තිය (සෙනෙවිරත්න, 2009, පිටු : 28) පාඨකයෙකු බොහෝ විට අනෙකුත් පුද්ගලයන් පිළිබඳව ප්‍රවෘත්ති දැන ගැනීමට කැමැත්තක් දක්වයි. මානව සංහතියේ නිදහසට, පැවැත්මට හානිදායක බිහිසුණු සිද්ධි හා අවස්ථා අපරාධ සම්බන්ධ ප්‍රවෘත්තිවලදී සලකා බැලේ. එමෙන්ම අපරාධ ප්‍රවෘත්ති වාර්තාකරණය ඉතාමත් සැලකිල්ලෙන් කළ යුත්තකි. එනම් අධිකරණයටත්, පුද්ගලයන්ටත් අපහාසයක් සිදු නොවන පරිදි පාඨකයාගේ කුතුහලය ඇවිස්සෙන ලෙස අපරාධ වාර් තාකරණය කළ යුතුය. (වැලිවිට, 1992, පිටු : 35) විශේෂයෙන් අපරාධයක් වාර්තා වී ඇති අවස්ථාවක සැකකරුවන්ගේ අනන්‍යතාව හඳුනා ගැනීම පිණිස අධිකරණය මගින් හඳුනා ගැනීමේ පෙරෙට්ටු පැවැත්වීමට නියමිතව ඇති නඩු කටයුතු වලදී මෙම අපරාධ වාර්තා කිරීම ඉතා සැලකිල්ලෙන් කළ යුතුය. එමෙන්ම ස්ත්‍රී දූෂණයක් හෝ අපචාරමය සිද්ධියක් වාර්තා කිරීමේදී පාඨකයාට හෝ ප්‍රේක්ෂකයාට වාර්තා කිරීමේ ක්‍රමවේදය රටක සිදුවන අපරාධ ප්‍රමාණය වැඩිකිරීමට නොව අඩුකිරීම ඉලක්ක කරගෙන වාර්තා කිරීම සිදු කළ යුතුය. (රාජපක්ෂ, 2009, පිටු : 97) ප්‍රවෘත්ති වාර්තාකරණයේදී කාලගුණ ප්‍රවෘත්ති සඳහාද අවධානය යොමු කරයි. පුවත්පත් වල කාලගුණ වාර්තාව කෙසේ වුවත් රූපවාහිනියේ හා ගුවන්විදුලියේ කාලගුණ වාර්තාව සඳහා බොහෝ දෙනා විමසිලිමත් වෙති. බටහිර රටවල නම් විද්‍යුත් මාධ්‍ය මෙන්ම ජීවිතයටද බලපාන ඒවාය. (කාරියවසම්, 1993, පිටු : 61) නමුත් ලංකාවෙය් මෙම තත්වය වෙනස්ය. මාධ්‍ය ආයතන වර්තමානයේදී තම ප්‍රවෘත්ති ප්‍රකාශය අතරට කාලගුණ වාර්තාව එක් රැස් කර ගැනීමට පුළුල් අවධානයක් යොමු කරන්නේ නැත.

තොරතුරු සම්පාදක මාධ්‍යවලදී ගැටුම් සම්බන්ධ ප්‍රවෘත්ති වලට වැදගත් ස්ථානයක් හිමිවේ. දේශීය හා විදේශීය වශයෙන් සිදුවන විවිධ ගැටුම් මතභේද සම්බන්ධ ප්‍රවෘත්ති මේ යටතේ විග්‍රහ කෙරේ. ඒ සම්බන්ධ අර්ථ දැක්වීමේදී ප්‍රබල උද්ධෘතයක් පෙන්වා දිය හැකිය.

“මිනිසා හා මිනිසා අතර ගැටුම් ජාතීන් හා ජාතීන් අතර ගැටුම්, එකඟවන හා එකඟ නොවන කොටස් අතර ගැටුම් වැනි ප්‍රවෘත්ති ගැටුම්කාරී ප්‍රවෘත්ති ගණයෙහිලා සැලකේ (සෙනෙවිරත්න, 2007, පිටු : 22)”

විෂය පාදක ප්‍රවෘත්ති කෙරෙහිද වාර්තාකරණයේදී විශේෂ අවධානයක් යොමු කරයි. ඉතිහාසය, සමාජවිද්‍යාව, පුරා විද්‍යාව, ජීව විද්‍යාය, ආදී විවිධ විෂයන් පාදක කර ගනිමින් ප්‍රවෘත්ති බිහිවන අවස්ථා දක්නට ලැබේ. (වලේබොඩ, 2010, පිටු : 74) ලෝකයේ යම් යම් දේවල් සඳහා වන නව සොයා ගැනීම් පිළිබඳව වැඩි අවධානයක් යොමු වේ. අසාමාන්‍ය ප්‍රවෘත්තියක් වශයෙන් විග්‍රහ කරන්නේ කලාතුරකින් සිදුව සාමාන්‍ය ක්‍රියාවකට වඩා නිතැතින්ම වෙනස් වන සිද්ධියක් හෝ අවස්ථාවකි. “බල්ලා විසින් මිනිසා සපා කන ලදී”යන්න සාමාන්‍ය ප්‍රවෘත්තියකි. එය වැදගත් ප්‍රවෘත්තියක්ද නොවේ. එහෙත් “මිනිසෙකු විසින් බල්ලෙකු සපා කන ලදී” යන ප්‍රවෘත්තිය ඉතා වැදගත් ප්‍රවෘත්තියකි. මෙය සිදුවීමක් ලෙස සලකා බැලීමේදී අසාමාන්‍ය ප්‍රවෘත්ති ගණයෙහිලා සැලකේ. (සෙනෙවිරත්න, 2007, පිටු : 24)

ප්‍රවෘත්ති වාර්තාකරණය තුළින් විදෙස් පුවත් සඳහාද වැඩි ඉඩ කඩක් වෙන්වේ. මෙම තත්වය රූපවාහිනී ප්‍රවෘත්ති තුල විශාල ලෙස දක්නට ලැබේ. නූතනය වන විට මෙරට ග්‍රාහකයන් විශාල පිරිසක් පෙරට වඩා විදෙස් පුවත් කෙරෙහි විශාල උනන්දුවක් දක්වයි. ඕනෑම ප්‍රවෘත්ති අංශයක විදෙස් පුවත් සඳහා වෙනමම අංශයක් පිහිටුවා තිබේ. (වැලිවිට, 1995, පිටු : 53) මෙරට ප්‍රවෘත්ති වාර්තාකරුවන් විදෙස් පුවත් සඳහා අන්තර්ජාතික ප්‍රවෘත්ති සේවාවන්ය. ඒ අනුව පෙනී යන්නේ විදෙස් පුවත්ද ප්‍රවෘත්ති වාර්තාකරණයේ කොටසක් බවයි. ප්‍රවෘත්ති වර්ගීකරණය පිළිබඳව ඉහත පරිදි සලකා බැලිය හැකිය.

## ගුවන් විදුලි ප්‍රවෘත්ති වාර්තාවක ආකෘතිය

ප්‍රවෘත්තියක් ගොඩනැගීම එක ක්‍රියාවලියකි. තමා විසින් සොයා ගත් එම ප්‍රවෘත්තිය තම ජනමාධ්‍ය ඔස්සේ ජනතාවට ඉදිරිපත් කිරීම තවත් ක්‍රියාවලියකි. එහෙයින් ප්‍රවෘත්ති කලාවේදියා ප්‍රවෘත්ති සොයා ගැනීමට මෙන්ම එසේ සොයාගත් ප්‍රවෘත්ති සිත්ගන්නා සුළු ලෙස පාඨකයා හමුවට ඉදිරිපත් කිරීමටද සමත් විය යුතුය. (ජගත්චන්ද්‍ර, 2003, පිටු : 66) ප්‍රධාන වශයෙන් **ගුවන් විදුලි** ප්‍රවෘත්ති ඇතුළු ප්‍රවෘත්තියක් ගොඩ නැංවීමේදී අනිවාර්යයෙන්ම සැළකිලිමත් විය යුතු කරුණු 06ක් පිළිබඳව කලකට ඉහත බටහිර රටවල ප්‍රවෘත්ති කාලාකරුවන්ගේ අවධානය යොමුව තිබුණි. එය වඩාත් සංක්ෂිප්තව හඳුන්වා ඇත්තේ 5W’S හා 1H යනුවෙනි. (දිසානායක, 1999, පිටු : 28)

1. What :- සිදුවූයේ කුමක්ද?
2. Who :- ඒ සඳහා මුල්වී ඇත්තේ කවුද?
3. When :- එය සිදු වූයේ කවදාද?
4. Where :- එය සිදුවූයේ කොහේද?
5. Why :- එය සිදුවූයේ ඇයි?
6. How :- එය සිදු වූයේ කොහොමද?


මෙම සම්ප්‍රදාය වත්මන් ප්‍රවෘත්තිකරණයේදී පවා සැලකිල්ලට ගැනෙතත් ඒ සඳහා වැඩි ඉඩ ප්‍රමාණයක් හෝ වැඩි ගවන් කාලයක් හෝ වැය කිරීමට සිදුවීම තරමක ප්‍රශ්නයක් වී ඇත. එහෙත් වර්තමානයේ පවතින ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය තුළින් එම ප්‍රශ්නයට විසඳුමක් ලබා ගැනීමට විද්‍යුත් මාධ්‍යයන් නියෝජනය කරන ප්‍රවෘත්ති කලාකරුවන්ට හැකි වී ඇතත් මුද්‍රිත අංශයේ මාධ්‍යවේදින්ට තවමත් එය ප්‍රශ්නයක්ව පවතින බවද නොරහසකි. කෙසේ වෙතත් 5W’S හා 1H යන සිද්ධාන්තය යටතේ සකස්කළ ප්‍රවෘත්තියක් මගින් අදාළ සිද්ධිය පිළිබඳව පැහැදිලි චිත්‍රයක් මවා ගැනීමට ග්‍රාහකයාට ඉඩ සැලසේ. තමන් විසින් ප්‍රකාශ කරනු ලබන කරුණු පිළිබඳව ග්‍රාහකයාට පැහැදිලි

අවබෝධයක් ලබාදීම වාර්තාකරණ ක්‍රියාවලියේ වැදගත් කරුණක් බව කිසිවිටකත් අමතක නොකළ යුතුය.

ප්‍රවෘත්ති වාර්තාවක් ලිවීමේදී සාම්ප්‍රදායික හා නූතන භාවිතයන් තුළ ක්‍රම කිහිපයක් අනුගමනය කෙරේ. ඒවා ප්‍රවෘත්ති වාර්තාවක් සංවිධානය කිරීමේ ප්‍රවේශ (Story Organization Approaches) ලෙස සලකනු ලබයි. (සෙනෙවිරත්න, 2007, පිටු : 44) ඒවා පහත පරිදි වේ.


1. මූලික වාර්තා සංවිධාන ප්‍රවේශය - (Basic Story Organization)
2. යටිකුරු පිරමීඩාකාර ප්‍රවේශය - (invented Pyramid Organization)
3. අනුපිළිවෙලින් සංවිධානය කිරීම- (chronological Organization)
4. රචනා ශෛලිය - (Essay Organization)
5. විනිවිද පෙනෙන ලෙස ලිවීම - -Hourglass Organization)

ප්‍රවෘත්ති වාර්තා සංවිධානය කිරීමේදී බොහෝ විට මූලික වාර්තා සංවිධාන ප්‍රවේශය භාවිතා කරයි. බොහෝ ප්‍රවෘත්ති වාර්තාවල අඩංගු විධි විධාන මූලික කරුණු කිහිපයක් මෙහි අන්තර්ගත වේ. ප්‍රවෘත්ති වාර්තාවක ප්‍රධාන කොටස මධ්‍ය භාගයේ ලියවෙන අතර අවසානයේ විකල්ප නිගමනය ගෙනහැර දක්වයි. එකී ආකෘතිය පහත පරිදි වේ.




**1.1** රූපය, මූලික වාර්තා සංවිධාන ප්‍රවේශය


යටිකුරු පිරමීඩාකාර ප්‍රවේශයද ප්‍රවෘත්ති වාර්තාකරනය සනඳහා භාවිතා කරයි. මෙය සම්මත ක්‍රමය ලෙසද සැලකේ. මෙහිදී සිදුවන්නේ වඩාත් වැදගත්ම තොරතුරේ සිට අඩු වැදගත්කමක් ඇති ප්‍රවෘත්තිය දක්වා වාර්තාව සංවිධානය කිරීමයි. යටිකුරු පිරමීඩ සංකල්පයේදී පළමු කොටසේ වැඩිම වැදගත්ම කරුණක්, පහළම කොටසේ වැදගත්කමින් අඩු කොටසත් ඒ අතරතුර අනෙකුත් තොරතුරුත් ඉදිරිපත් කරනු ලබයි. (වීරකෝන්, 2006, පිටු : 20) එසේ ඉදිරිපත් කරන ක්‍රමවේදය පහත පරිදි වේ.




**1.2** රූපය, යටිකුරු පිරමීඩාකාර ප්‍රවේශය


මෙම ආකෘතිය මඟින් ප්‍රවෘත්ති වාර්තාවේ උපුටා ගැනීම් හෝ පසුබිම් තැබිය යුතු තැන පෙන්වීම අදසහ් නොකෙරේ. ඊට හේතු වන්නේ සෑම ප්‍රවෘත්තියක්ම එහි අන්තර්ගතය මත තීරණය වන බැවිනි. එමෙන්ම මෙම ආකෘතිය බෙහෙවින් වැදගත් වන්නේ උණුසුම් පුවත් හෝ වැදගත් ප්‍රවෘත්ති වාර්තා කිරීමේදීය. යටිකුරු පිරමීඩ ආකෘතියේදී මුලින්ම ග්‍රාහකයාට පැවසිය යුත්තේ සිදුවී ඇත්තේ කුමක්ද යන්නය. උදාහරණයක් වශයෙන් ප්‍රබල සුනාමි තත්වයක් සළකා බැලිය හැක. එහිදී මිය ගිය පුද්ගලයන් ගණන, අතුරුදහන් වූ පුද්ගලයන් ගණන හා සිදුවී ඇති දේපල හානි පිළිබඳ වාර්තා කිරීම අවශ්‍ය වේ. ඒ අනුව යටිකුරු පිරමීඩයේ ඉහළටම යෙදෙන්නේ එම තොරතුරුය. පසුව ක්‍රමයෙන් සෙසු විස්තර පිරමීඩයේ පහළට ගලාගෙන යාම සිදුවේ. (කුමාර, 2006, පිටු : 83)

කිසියම් සිද්ධියක් විස්තර කිරීමේදී අනුපිළිවෙලකට තොරතුරු ගොනු කළ යුතුය. අනුපිළිවෙල සංවිධාන ප්‍රවේශ ප්‍රවෘත්ති සංවිධානයේදී භාවිතයට ඉතා සුදුසු වේ. එයට හේතුව එමඟින් නිතරම වඩාත් වැදගත් තොරතුරු මුලින් යෙදෙන නිසාය. ප්‍රවීන පුවත්පත් කලාවේදීන් විසින් අනුපිළිවෙල සංවිධාන ප්‍රවේශය භාවිතයේදී සාරාංශ හැදින්වීමක්ද යොදාගනු ලබයි. (සෙනෙවිරත්න, 2007, පිටු : 49) අනුපිළිවෙළ සංවිධානය කිරීමේ ප්‍රවේශයේ ක්‍රමවේදය පහත පරිදි දැක්විය හැකිය.




**1.3** රූපය, අනුපිළිවෙළ සංවිධාන ප්‍රවේශය

මෙම ක්‍රමය භාවිතා කිරීමෙන් වැදගත් සිදුවීම අනුපිළිවෙලින් වාර්තාවක ගොඩනගයි. එමෙන්ම මෙම ප්‍රෙවිශය වැඩි වශයෙන් යෙදෙන්නේ කවර හෝ හැඳින්වීමකුත් සමඟයි. සංකීර්ණ සිද්ධි වාර්තාකරණයේදී ගුවන් විදුලි හා රූපවාහිනි වාර්තාකරුවන් බොහෝවිට මෙම අනුපිළිවෙළ ප්‍රවේශය යොදා ගත ගනිති. ඊට හේතුව වන්නේ අසන්නාට හා නරඹන්නාට අනුපිළිවෙල සංවිධාන ආකෘතිය තේරුම් ගැනීමට ඉතාම පහසුවීමයි.
රචනා ශෛලිය ප්‍රවේශයද ප්‍රවෘත්ති වාර්තාකරණයේදී භාවිතා කරන ආකෘතියකි. මෙම ප්‍රවේශය ප්‍රධාන වශයෙන් කතෘ වාක්‍ය, තීරු ලිපි හෝ දිගු ලිපි, සඟරාමය ලිපි ලිවීමේදී භාවිතා කරයි. (සෙනෙවිරත්න, 2007, පිටු : 57)




**1.4** රූපය, රචනා ශෛලිය ප්‍රවේශය

රචනාවක් ආරම්භ වන්නේ පරමාර්ථ ප්‍රකාශවන වාක්‍යයකිනි. රචනාවක් පටන්ගත යුත්තේ ග්‍රාහකයාට තමාගේ ප්‍රධාන දැක්ම ප්‍රකාශ කරමින්ය. ප්‍රධාන කරුණ ප්‍රකාශ කිරීම සඳහා රචනාවේ මැද සිද්ධිය හෝ කරුණු ආධාර කර ගත යුතුය. අවසාන කොටසේදී සාරාංශ එකතු කරන අතර රූපවාහිනි හා ගුවන් විදුලි ප්‍රවෘත්ති වාර්තාකරණයේදී කාලානුරූපව රචනා ශෛලිය ප්‍රවේශය භාවිතා කරනු ලබයි. විනිවිද පෙනෙන ලෙස සංවිධානය කිරීමේ ප්‍රවේශයද ප්‍රවෘත්ති වාර්තාකරණයේදී භාවිතා කරන නව ආකෘතියකි.

මෙම ප්‍රවේශය යටිකුරු පිරමීඩාකාර ප්‍රවේශයේ සංවර්ධිත අවස්ථාවක් ලෙසද හැඳින්විය හැකිය. මෙම නව ආකෘතිය ප්‍රවෘත්ති වාර්තාකරණය සඳහා හඳුන්වා දුන්නේ සෙන් පීටර්ස්බර්ග් හි පොයින්ට ආයතනයේ පීඨාධිපතිවරයකු වූ "රෝයි පීටර් ක්ලාක්" මහතාය. ඔහු පවසන ආකාරයට මේ ක්‍රමය යටිකුරු පිරමීඩාකාර ප්‍රවේශයට විකල්පයක් වශයෙන්ද භාවිතා කළ හැකිය. (කුමාර, 2008, පිටු : 83) එමෙන්ම විනිවිද පෙනෙන ලෙස සංවිධානය කිරීමේ ප්‍රවේශය ඉතා නම්‍යශීලි ප්‍රවේශයක් ලෙසද සැලකේ. මෙහි හැඩය වන්නේ ප්‍රවෘත්ති වාර්තාවේ මුල හා අග පුළුල් වීමයි. අවසානයේදී හා මුලදී වඩාත් ශක්තිමත් කරුණු ඉදිරිපත් කෙරේ.

මෙම ප්‍රවේශයෙන්ගෙන් ගෙනහැර දක්වන්නේ න්‍යායික කරුණු වුවත් ඇතැම් අවස්ථාවලදී මෙම න්‍යායයන් කාලාත්මකව උල්ලංඝනය කරනු දක්නට ලැබෙයි. මානුෂීය හැඟීම් දනවන ප්‍රවෘත්ති වාර්තාකරණයේදී මීට වඩා වෙනස් අයුරකින් භාවිතාවන අයුරු දක්නට ලැබේ. නමුත් මෙහිදී මතක තබා යුත්තේ "සම්මතය බිඳීමට පෙර සම්මතය හොඳින් හැදෑරිය යුතු බවයි". නැතිනම් බිහිවන්නේ දෙපැත්තටම නැති විකෘති නිර්මාණයන්ය. ප්‍රවෘත්ති වාර්තා කිරීමේ ආකෘතීන් ඉහත පරිදි දැක්විය හැකිය.

## ගුවන් විදුලි ප්‍රවෘත්තික ප්‍රවෘත්තිමය වටිනාකම තීරණය කිරීම

මාධ්‍ය ආයතනයකට ලැබෙන සෑම තොරතුරක්ම වටිනාකමක් සහිත ප්‍රවෘත්තියක් වන්නේ නැත. මාධ්‍ය ආයතනයකට ලැබෙන තොරතුරු අතරින් වටිනාකමක් සහිත ප්‍රවෘත්ති කවරේද යන්න තීරණය කිරීම වාර්තාකරු හා සංස්කාරවරයා විසින් තීරණය කළ යුතුය. සිද්ධියක ප්‍රවෘත්තිමය වටිනාකම් අවධාරණය කර ගැනීමට උපකාර පිණිස ලොව පුරා මාධ්‍ය වේදීහු ප්‍රවෘත්ති වටිනාකම් සමූහයක් ස්ථාපිත කර ගෙන සිටිති. බටහිර ප්‍රවෘත්ති විශාරදයන් සඳහන් කරන අන්දමට කිසියම් සිද්ධියක් ප්‍රවෘත්තියක් ලෙස සැලකීමට මුල්විය හැකි මූලික කරුණු 03කි. (දිසානායක, 1999, පිටු : 23)

1. වැඩි පිරිසකට සම්බන්ධ හෝ වැඩි දෙනෙකුගේ අවධානයට යොමු කරගන්නක් වීම.
2. අසාමාන්‍ය සිදුවීමක් ලෙස හැඳින්විය හැකි කරුණක් වීම.
3. සමාජයේ ප්‍රමුඛත්වයෙන් සැලකෙන පුද්ගලයන්ට සම්බන්ධ කරුණක් වීම.

ඉහත කරුනු වලට අමතරව පහත සඳහන් කරුණුද සිද්ධියක ප්‍රවෘත්තිමය වටිනාකම තීරනය කිරීම කෙරෙහි බලපානු ලැබේ. (දිසානායක, 1999, පිටු : 26)

- ප්‍රවෘත්ති වෙනස්වීම
- ගැටුම් පිළිබඳ ප්‍රවෘත්ති
- කාලීන බව
- බලපෑම
- සමීපබව
- මතභේදයට තුඩුදීම
- සිදුවීමේ ප්‍රවණතාව
- ප්‍රධාන පෙළේ ජාතීන්ට අදාලවීම
- අවිරෝධය
- තරඟකාරීත්වය
- අනුබල සැපයීම
- අවස්ථානුකූලව ඉඩ සැලසීම
- කලින් සැලසුම් කරන ලද අවස්ථා

බටහිර විශාරදයන් පෙන්වාදෙන ආකාරයට වැඩි පිරිසකට සම්බන්ධ හෝ වැඩි පිරිසකගේ අවධානයට යොමු වූ කරුණක ප්‍රවෘත්ති වටිනාකම ඉහළය. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ඉහළ නැංවීමක් හෝ ඔවුන් මෙතේක් භුක්ති විඳිමින් සිටි සේවා අයිතිවාසිකමක් රජය විසින් කප්පාදු කර දැමීමක් ඊට කදිම නිදසුනකි. (ජගත්චන්ද්‍ර, 2003, පිටු : 25) සමාජයේ වැඩි පිරිසකට බලපාන මෙවැනි තීරණක් පිළිබඳව දැන ගැනීමට සමාජයේ බොහෝ දෙනෙකු කැමතිය. එසේ වන්නේ එහි ප්‍රතිඵලය භුක්ති විඳින්නන් අතර කමන්ද සිටින බව එකී ප්‍රවෘත්ති ග්‍රාහකයන් හොඳින්ම දන්නා බැවිනි.

කලකට ඉහත මිනිසා සඳමත පා තැබීම අසාමාන්‍ය සිදුවීමක් සිදුවිය. 1969 වර්ෂයේදී සිදුවූ එම සිදුවීම ලොව සිටින කෝටි සංඛ්‍යාත ජනතාවගේ දැඩි අවධානයට යොමු වූවකි. එංගලන්තයේ ඩයනා කුමරියගේ මළගම හා 2001 වර්ෂයේදී ඇමරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයද , 2011 වර්සයේ ඇමරිකාව විසින් බිල් ලාඩින්ව ඝාතනය කිරීමද ඊට සමාන සිදුවීම් විය. එවැනි සුවිශේෂී සිදුවීම් වල ඉහළ ප්‍රවෘත්ති වටිනාකමක් පවතින බව ප්‍රවෘත්ති විශාරදයින්ගේ මතයයි. වේලුපිල්ලේ ප්‍රභාකරන්, ඔසාමා බිල් ලාඩින් වැනි ත්‍රස්තවාදී නායකයින්ගේ ඝාතනයන් පිළබඳ තොරතුරු ලොව පුරා ප්‍රචලිත වූයේ ඔවුන් ත්‍රස්තවාදීන් ලෙස ලොව ප්‍රකට වී සිටි හෙයිනි. එසේම රාජ්‍ය නායකයන්, ක්‍රීඩකයන්, කලාකරුවන් වැනි චරිත පිළිබඳව පළවන ප්‍රවෘත්තිවල ඉහළ ප්‍රවෘත්තිමය

වටිනාකමක් පවතී. එසේම කාලීන වූත් සමීප වූත්, බලපෑම් සහගත වූත් ප්‍රවෘත්තිවල ඉහළ වටිනාකමක් පවතී.

ගැටුම් පිළිබඳවූ ප්‍රවෘත්තිවලද ඉහළ ප්‍රවෘත්තිමය වටිනාකමක් පවතී. ගැටුම කොතරම් සිදුවුවත් එම ගැටුම් වලින් විශාල විනාසයක්, යුද්ධයක් සිදුවන්නේ නම් එය ප්‍රවත්තියක් ලෙස වටිනාකමක් ඇත. කුඩා කණ්ඩායමක් අතර පවතින ගැටුම් මිනී මැරුමක් දක්වා දුරදිග ගියේ නම් පමණක් එය ප්‍රවෘත්තියක් ලෙස වටිනාකමක් ඇත. එසේ ගැටුමකට තුඩු දෙන වාද විවාද කණ්ඩායමක් වශයෙන් එකතු වී සිදු කරන උද්ඝෝෂණ ආදියද ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇත. (කුමාර, 2008, පිටු : 18)

ප්‍රවෘත්ති සිදුවීමේ වේගවත් බව හෝ ක්ෂණික බව අනුවද වටිනාකම නිර්ණය වේ. උදාහරණයක් වශයෙන් සිව් වාර්ෂික සංවර්ධන සැලැස්මවල් සම්බන්ධයෙන් ලැබෙන ප්‍රවෘත්ති ආවරණයට වඩා වැඩි අවධානයක් රථවාහන අනතුරු සම්බන්ධයෙන් දක්නට ලැබේ. ඊට හේතු වන්නේ රථවාහන අනතුරු රටවටා නිරන්තරයෙන් සිදුවන බැවිනි.

ප්‍රවෘත්තිකරණයේ ඇති තවත් ලක්ෂණයක් නම් නිශේධනාත්මක දේ සඳහා වැඩි අවධානයක් ලබා දීමයි. උදාහරණයක් ලෙස තරුණ තරුණියන්ගේ සදාචාර සංවර්ධන වැඩසටහන් සඳහා ලැබෙන මාධ්‍ය ආවරණ සීමා සහිතය. එහෙත් මහා පරිමාණ මංකොල්ල කෑමක් පිළිබඳව මාධ්‍ය ආයතන විසින් ඉහළ ප්‍රචාරයක් ලබා දෙයි. පුද්ගලයින් ගේ අත්දැකීම හා බද්ද වූ ප්‍රවෘත්ති සඳහාද වැඩි අගයක් ඇත. එබැවින් මානව සංවේදී ගුණය ප්‍රවෘත්තියකට ලැබේ. මානව සංවේදී පුවත් ඇසීමට හා දැකීමට ජනතාව විශේෂ නැඹුරුතාවයක් දක්වයි. (කුමාර, 2008, පිටු : 20)

විශේෂයෙන් ප්‍රවෘත්තියක අගය හෙවත් වටිනාකම තීරණය කිරීම කරුණු රාශියක් මත සිදුවන බව මේ අනුව පැහැදිලිය. මෙම සාධක මාධ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක කිරීමට යාමේදී ගැටලු රාශියක් උද්ගත විය හැකිය. ඇතැම් අවස්ථාවලදී දේශපාලන හා ආර් ථිකමය පීඩනය තුලින් ප්‍රවෘත්තියක වටිනාකම තීරණය කිරීමේ සාධක නිශ්ඵල තත්වයකට පත් කරන අතර එවැනි අවස්ථාවලදී වෙනස් අවස්ථාවකට උචිත පරිදි කටයුතු කිරීමට වාර් තාකරුවා වගබලා ගත යුතුය. (දිසානායක, 1999, පිටු : 27)

## ගුවන් විදුලි ප්‍රවෘත්ති ශෛලිය

ගුවන් විදුලි ප්‍රවෘත්ති අංශයෙන් අංශයට භාවිත කරන ශෛලිය වෙනස් වේ. එනම් ඒ ඒ ආයතනයට පිළිගත් ප්‍රවෘත්ති ශෛලියක් තිබේ. විශේෂයෙන් විද්‍යුත් මාධ්‍ය සඳහා භාවිතා කරන ප්‍රවෘත්ති මුද්‍රිත මාධ්‍ය වලට වඩා වෙනස් වේ. ගුවන් විදුලි ප්‍රවෘත්ති කෙටිය. උද්ධෘත වාක්‍ය, සංවාද වලින් තොරය. නමුත් ගුවන් විදුලි ප්‍රවෘත්තිද ඉතා පැහැදිලිව ලිවීම අනිවාර් යය වේ. තමන් පටිගත කර නොගතහොත් ගුවන්විදුලි ප්‍රවෘත්ති ඇසෙන්නේ එක් වරක් පමණි. එහෙයින් ග්‍රාහකයාට පහසුවන පරිදි ව්‍යවහාරාත්මක භාෂාව මේ මාධ්‍යට අවශ්‍ය වෙයි. (කාරියවසම්, 1993, පිටු : 15)

ගුවන් විදුලිය යනු ශ්‍රව්‍ය මාධ්‍යකි. ගුවන් විදුලි ප්‍රවෘත්ති ග්‍රාහකයාට ග්‍රහණය කර ගැනීමද ඉතා පහසුය. විශේෂයෙන් ගුවන් විදුලි ප්‍රවෘත්ති වාර්තාකරුවන් සරල ලෙස හා ප්‍රබල ලෙස සිය වාර්තාකරණය පුහුණු කළ යුතුය. ප්‍රධාන වශයෙන් ගුවන් විදුලි ප්‍රවෘත්ති ශෛලින් දෙකක් දැකිය හැකිය. එනම් ලිඛිත ශෛලිය හා වාචික ශෛලියයි. (කාරියවසම්, 1993, පිටු : 16)

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ප්‍රවෘත්ති වාර්තාකරණය සඳහා යොදා ගන්නේ ලිඛිත ශෛලියයි. ලිඛිත ශෛලියෙන් ප්‍රවෘත්ති වාර්තාකරණය තුළින් එම ප්‍රවෘත්තිවල විශ්වසනීයත්වය ගොඩනැගෙන බව එම මාධ්‍ය ආයතනය විශ්වාස කරයි.

**උදා. රටතුල සිදුවන භෞතික සංවර්ධනයට සමගාමීව අධ්‍යාත්මික සංවර්ධනයද සිදුවිය යුතු බව ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පවසයි. ජනාධිපතිතුමා මේ බව අවධාරණය කළේ ඊයේ මහියංගනය ජාතික පාසලේ පැවැති උත්සවයකට සහභාගී වෙමිනි.**

මෙම ප්‍රවෘත්ති ශෛලියට වඩා වෙනස් වූ ප්‍රවෘත්ති ශෛලියක් වෙනත් පුද්ගලික ගුවන් විදුලි නාලිකාවල භාවිතා කරයි. ඔවුන් යොදාගනු ලබන්නේ වාචික ශෛලියයි. එනම් කථාකරන භාෂාවෙන් ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමට ඔවුහු කටයුතු කරති.

උදා. **මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන්ට ප්‍රහාර එල්ල කරන සැකකරුවන් අත්ඩංගුවට ගැනීම සඳහා පරීක්ෂණ සිදුවන බව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා පවසනවා. අමාත්‍යවරයා මේ බව සඳහන් කළේ අද කොළඹදී පැවැති කැබිනට් තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡාවට සහභාගී වෙමිනි.**

මෙම ප්‍රවෘත්ති ශෛලිය ජනතාවට ඉතාම සමීප බව මෙම ශෛලිය හොඳින් අනුගමනය කරන මාධ්‍ය ආයතන විශ්වාස කරයි. විශේෂයෙන් ලිඛිත ශෛලියට වඩා මෙම ප්‍රවෘත්ති ශෛලිය වඩා ආකර්ශනීයබවක් පෙන්වයි. සිරස ප්‍රවෘත්ති ප්‍රකාශය ජනප්‍රිය වීමටද ඔවුන් අනුගමනය කරන මෙම ප්‍රවෘත්ති ශෛලියද බලපානු ලබයි. එමෙන්ම සියත TV ප්‍රවෘත්ති විකාශය තුළද දක්නට ලැබෙන්නේ සිරස ප්‍රවෘත්ති ශෛලියටම සමාන වූ රටාවකි. දෙරණ නාලිකාවේද එම තත්වට දක්නට ඇත. ඒ හේතුවෙන් වැඩි ප්‍රේක්ෂක අවධානයක් දිනා ගැනීමට එම නාලිකා සමත්ව ඇත.

ඉහත කරුණු අනුව පැහැදිලි වන්නේ මාධ්‍ය ආයතන සිය ප්‍රවෘත්ති විකාශයන් තුළද විවිධ ශෛලීන් අනුගමනය කරන බවයි. සිරස, සියත,නෙත් වැනි මාධ්‍ය ආයතන භාවිතා කරන ප්‍රවෘත්ති ශෛලිය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව තුළ භාවිතා කරන්නේ නැත. ඒ අනුව පෙනී යන්නේ ඒ ඒ මාධ්‍ය ආයතන ඔවුන්ටම ආවේණික වූ ශෛලියක් භාවිතා කිරීමට උතසාහ දරන බවයි.

## ගුවන් විදුලි ප්‍රවෘත්ති සිරස්තල රචනය

සිරස්තල යෙදීම පිළිබඳව **ගුවන් විදුලි** ප්‍රවෘත්ති විකාශය තුළදී වැඩි අවධානයක් යොමු කරයි. ප්‍රවෘත්ති ප්‍රකාශයේ ආකර්ශනීය බව රඳවා තබා ගැනීමට ප්‍රධාන ප්‍රවෘත්ති සිරස්තල යෙදීම අත්‍යාවශ්‍ය වේ. ඉතා ආකර්ශනීය ලෙස සිරස්තල යෙදීම ප්‍රවෘත්ති සංස්කාරවරයකු සතු විශේෂ දක්ෂතාවයකි. ඉතා කෙටි වදන් පෙළකින් ප්‍රවෘත්ති අයිතමයේ අදහස ක්ෂණිකව කියැවෙන පරිදි සිරස්තල යෙදීමට සංස්කාරවරයා කටයුතු කළ යුතුය. (කුමාර, 2008, පිටු : 93) එසේම ප්‍රවෘත්ති සිරස්තලය තුළ යම් ප්‍රචාරාත්මක තීරණය කිරීම බොහෝ විට ප්‍රවෘත්ති සිරස්තලවල ආකර්ශනීය බව මත රඳා පවතියි.

**ගුවන් විදුලි** ප්‍රවෘත්ති සිරස්තලයක පැවතිය යුතු අනිවාර්යය ගුණයක් නම් හැකිතාක් "කෙටි වීමයි" ප්‍රවෘත්තියෙන් කියැවෙන තොරතුර කෙටි කර දැක්වීම සිරස්තල යෙදීමෙන් අපේක්ෂා කෙරේ. ප්‍රවෘත්තියේ සමස්ත අර්ථය උකහා ගෙන එහි ඇති වැදගත්කම ස්ථානයෙන් සිරස්තලය ග්‍රහණය කර ගත යුතුය. එබැවින් සංස්කාරකවරයා සිරස්තලය යෙදීමට පෙර ප්‍රවෘත්තිය සම්පූර්ණයෙන්ම කියවා පූර්ණ අවබෝධයකින් පසුවිය යුතුය. ප්‍රවෘත්තියේ යම් තැනක් ගැටළු සහගත නම් සංස්කාරනවරයා කළ යුත්තේ ඒ පිළිබඳව අදාල වාර්තාකරුවාගෙන් විමසීමය. එසේ කිරීමෙන් වැරදි සහගත සිරස්තලයක් පළවීම වැළැක්වෙනු ඇත. ඒ අනුව පෙනී යන්නේ ප්‍රවෘත්ති සිරස්තලය කෙටිවීම ඉතා වැදගත් බවයි. (දසනායක, 1999, පිටු : 28)

**ගුවන් විදුලි** ප්‍රවෘත්ති සිරස්තලය ආකර්ශනීය වන ලෙස යොදවා ගැනීම සඳහා මාධ්‍ය ආයතන ඒ ඒ ආයතනයට ආවේණික දැක්ම භාවිතා කරයි. ඇතැම් නාලිකා ප්‍රවෘත්ති සිරස්තල කියවීම සඳහා පමණක් වෙනම නිවේදකයකු යොදා ගැනී. දෙරණ, සිරස වැනි **ගුවන් විදුලි** නාලිකාවල මෙම තත්වය ප්‍රධාන වශයෙන් දක්නට ලැබේ.

**ගුවන් විදුලි** ප්‍රවෘත්ති සිරස්තල සඳහා යොදා ගනු ලබන රූප රාමුද ඉතාම වැදගත් වේ. ප්‍රවෘත්තියේ ඇති හොඳම හා ආකර්ශනීයම රූප රාමු පෙළ සිරස්තලය සඳහා භාවිතා කළ යුතුය. එමගින් සිදු කරන්නේ ප්‍රවෘත්තිය පිළිබඳව ප්‍රේක්ෂකයා තුළ කුතුහලයක් ඇති කිරීමයි. මෙම රූප රාමු තෝරා ගැනීමේදී ප්‍රවෘත්ති සංස්කාරවරයාට වැඩි වගකීමක්ද පැවරේ. එසේම සිරස්තලය සඳහා භාවිතා කරන රූප රාමු වල නිරවද්‍යතාවය පිළිබඳ වගකිව යුතු වන්නේද ප්‍රවෘත්ති සංස්කාරවරයාමය. (කුමාර, 2008, පිටු : 94)

පහත දැක්වෙන්නේ 2011-08-04 වන දින සියත ගුවන් විදුලියේ සවස 06.30 ප්‍රධාන ප්‍රවෘත්ති සිරස්තලයයි. එමඟින් **ගුවන් විදුලි** ප්‍රවෘත්ති සිරස්තල පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමට අපට අවස්ථාව උදා වේ.

- ❖ මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන්ට එල්ලවූ ප්‍රහාර සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකරන බව රජය පවසයි.
- ❖ උදයන් මාධ්‍ය වේදියාට එල්ල වූ ප්‍රහාරය පිළිබඳව ඇමරිකාවේ කණස්සල්ල.
- ❖ පලාත් පාලන මැතිවරණයේ තෙවන අදියරට නාම යෝජනා කැඳවයි.
- ❖ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අනු කමිටු 06ක්

යම් දිනයකට ප්‍රවෘත්ති අතරින් හොඳම ප්‍රවෘත්ති තෝරාගෙන ඊට සිරස්තල යෙදීම මෙහිදී සිදුවේ. සාමාන්‍ය යෙන් රූපවාහිනි ප්‍රවෘත්ති විකාශයක සිරස්තල හතරක් හෝ පහක් භාවිතා කරයි. විදේශීය හා ක්‍රීඩා පුවත්වලින් එක් සිරස්තලය බැගින් ගෙන අනෙක් සිරස්තල දේශීය ප්‍රවෘත්ති වලට අදාළව භාවිතා කරයි. ඉහත පරිදි සියත ප්‍රවෘත්ති අංශයේ සිරස්තල භාවිතා කළද ඒවායේ ස්වරූපය මාධ්‍ය ආයතනයෙන් ආයතනයට වෙනස් වේ. ස්වර්ණවාහිනි ප්‍රවෘත්තිවල භාවිතා කරන්නේ මෙයට වඩා වෙනස්ම වූ ප්‍රවෘත්ති සිරස්තල රටාවකි. රාජ්‍ය මාධ්‍ය ආයතනවලද එසේමය.

විශේෂයෙන්ම සිරස්තල තෝරා ගැනීමද ඒ ඒ මාධ්‍ය ආයතන වලට අනුව වෙනස් වේ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව රජයට පක්ෂපාතී ලෙස සිරස්තල භාවිතා කරයි. සිරස, සියත,දෙරණ, වැනි ගුවන් විදුලි නාලිකා මධ්‍යස්ථ ස්වරූපයකින් සිරස්තල යොදන බව පෙනෙන්නට ඇත. යොදනු ලබන සිරස්තල ඒ ඒ මාධ්‍ය ආයතනයේ දේශපාලන දෘෂ්ටිය මත වෙනස් වන බව පැහැදිලි කාරණයකි. විශේෂයෙන් **ගුවන් විදුලි** ප්‍රවෘත්ති සිරස්තල යෙදීම ඉතා වගකීමකින් සිදු කළ යුතු කටයුත්තකි.

## ගුවන් විදුලි ප්‍රවෘත්ති සංස්කරණය

මාධ්‍ය මගින් ප්‍රකාශිත සෑම ප්‍රවෘත්තියකටම සංස්කාරකවරයා වගකිව යුතුය. ප්‍රවෘත්තියේ හැඩය තීරණය කිරීමේ ඉතා වැදගත් කාර්යභාරයක් ප්‍රවෘත්ති සංස්කාරකවරයා ඉටු කරයි. ප්‍රවෘත්තිය සම්බන්ධව සංස්කාරකවරයා වාර්තාකරුවා සමඟ සාකච්ඡා කරයි. එසේම ප්‍රවෘත්තියට එක් කළ යුතු තොරතුරු ඇත්ද යන්න විනිශ්චය කරයි. ඒ අනුව විවිධ අංශ ඔස්සේ තවත් කරුණු සෙවීම සඳහා සංස්කාරකවරයා විසින් වාර් තාකරුවෝ යොදවනු ලැබෙති. (ගුණසේකර, 2006, පිටු : 82)

ප්‍රවෘත්තියක් ඉදිරිපත් කරන මුහුණුවර තීරණය කරනු ලබන්නේ සංස්කාරකවරයා විසිනි. සමහර අවස්ථා වලදී ප්‍රවෘත්ති කළමණාකරුගේ සිතුම් පැතුම් අනුවද එහි ස්වරූපය වෙනස් වේ. ප්‍රවෘත්ති

සඳහා හඬ පට එක් කිරීමද, රූප රාමු එක් කිරීමද සංස්කාරකවරයා විසින් සිදු කරයි. හොඳ ප්‍රවෘත්ති සම්පාදනයකදී සංස්කාරකවරයා විසින් ප්‍රවෘත්ති වාර්තාව නැවත ලියනු ලබයි.

වාර්තාකරුවන් විසින් ලියන ලද ප්‍රවෘත්ති පිටපතේ වැරදි ඇත්දැයි හොඳින් පරීක්ෂා කර බැලීම ප්‍රවෘත්ති සංස්කාරකවරයා සතු කාර් යභාරයකි. කෙසේ වෙතත් වාර්තාකරුවා විසින් සංස්කාර කවරයා වෙත ප්‍රවෘත්ති අයිතමය ඉදිරිපත් කළ යුත්තේ එහි වැරදි ඇත්දැයි හොඳින් පරීක්ෂා කිරීමෙන් පසුවයි.
වාර්තාකරුවා විසින් ගිලිහුණු දෝෂයක් වෙතොත් එය සොයා ගැනීම සංස්කාරකවරයා සතු කාර්යයකි. නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම ප්‍රවෘත්ති අයිතමයක් සංස්කරණයේ ඇති මූලිකම කාර්යයි. වාර්තාවේ සඳහන් පුද්ගල නාම, දින, ඇතුළු එහි සෑම තොරතුරක් එකින් එක නැවත පරීක්ෂා කර බැලීම මෙහිදී අපේක්ෂා කෙරේ.
වාර්තාකරුවාගේ ප්‍රවෘත්ති පිටපත අතට ගත් විට සංස්කාරකවරයා සිය සිතෙහි නඟාගත යුතු ප්‍රශ්න කීපයකි. ඒවා පහත පරිදි වේ. (කුමාර, 2008, පිටු : 88)

- සිද්ධියට අදාල තොරතුරු වාර්තාකරුවා දැන ගත්තේ කෙසේද?
- මේ සිද්ධිය ග්‍රාහකයා විශ්වාස කළ යුත්තේ ඇයි?
- වාර් තාවේ දැක්වෙන ප්‍රධාන තොරතුරු එහි දැක්වෙන සෙසු තොරතුරු වලින් සහයක් ලැබේද? එම තොරතුරු ප්‍රධාන තොරතුරු සමඟ ගැලපේද?
- වාර්තාවේ දැක්වෙන් මූලාශ්‍ර නිවැරදිද? එම මූලාශ්‍රය අදහස් කළ දේ වාර්තාකරුවා නිසි පිරිදි සිය වාර් තාවට ඇතුලත් කර ඇත්ද?
- සියළු පාර්ශව වලට සාධාරණක් ඉටු කර තිබේද?
- යම් කාරණයක් මෙම වාර්තාවෙන් ගිලිහී ගොස් ඇත්ද?
- මෙම ප්‍රවෘත්ති වාර්තාව සාධාරණ එකක්ද? සංස්කාරණය කෙරෙන

ප්‍රවෘත්තිය හඬ නඟා කියවීම විද්‍යුත් මාධ්‍යයේදී විශේෂයෙන් සැළකිය යුතු කරුණකි. ප්‍රවෘත්ති සංස්කාරකවරයාට වාර්තාකරුගෙන් විමසීමක් නොකොට වෙනස්කළ හැකි කරුණු වන්නේ අනවශ්‍ය වාක්‍ය දීර්ඝ වීම වැලැක්වීම. එකම කරුණ කීප වරක් යෙදී තිබීම, ඉවත් කිරීම තේරුමක් නොමැති වාක්‍යය ඉවත් කිරීම වැනි දෑය. (වලේබොඩ, 2010, පිටු : 67) විශේෂයෙන් සංස්කාරකවරයා යනු තව දුරටත් සෝදුපත් බලන්නෙකු නොවේ. ඔහු ඊට වැඩි බලයක් සහිත පුද්ගලයෙකි. එසේම ඔවුන්ද වාර්තාකරුවන් මෙන්ම සෑම අවස්ථාවකදීම මාධ්‍යවේදීහු කොටසක් වෙති. බොහෝ **ගුවන් විදුලි** ප්‍රවෘත්ති අංශවල සේවය කරන සංස්කාරකවරු කලක් වාර්තාකරුවන් වශයෙන් සේවය කර තිබීම සාමාන්‍ය තත්වයකි. වාර් තාකරණයේ අත්දැකීම් තිබීම සංස්කාරකවරයකුට බෙහෙවින් වැදගත් වේ. එබැවින් ප්‍රවෘත්ති සත්‍යතාව හා සාධාරණත්වය පිළිබඳ විශේෂ ඉවක් ඔවුන් සතුවේ. (කුමාර, 2008, පිටු : 88)

සංස්කරණයේ අවසාන ඉලක්ක වන්නේ කතාවේ පණිවුඩය ශ්‍රාවකයාට ලබා දීමයි. රූපවාහිනියේ ප්‍රවෘත්ති වාර්තාකරණයේදී මෙය ලඟාකර ගත හැක්කේ වාචික විවරණයකින්, අටුවාවකින් හෝ ලිඛිත තොරතුරු පත්‍රයකින්ය. විශේෂයන් ප්‍රවෘත්ති පිටපත සංස්කරණය සේම රූප සංස්කරණයද  අතිශයින් වැදගත් වේ. එයද සංස්කරණයේ තවත් පැතිකඩකි. දෘශ්‍ය සංස්කරණය තුලදී බොහෝ විට කැපීම යන වචනය භාවිතා කරයි. මෙමගින් යම් චිත්‍රයක් ඉවත් කර දැමීම, යම් අනුපිළිවෙලවල් නොසලකා හැරීම සහ කාලය හා දුර වැනි දේවල් කෙටි කිරීම සිදු කෙරේ. (දිසානායක, 1999, පිටු : 208) විනාඩි 30ක්ම කරගෙන ගිය කතාවක් එක් විනාඩියක් වැනි කෙටියෙන් රසවිඳිය හැකි අනුපිළිවෙලක් වන ලෙසට කැපිය හැකිය. පැය 05 ක් තිස්සේ සිදුවන පෙළපාළියක් තත්පර 30කින් පමණ සංස්කරණය කල හැකිය. ඒ කෙසේ වෙතත් නරඹන්නාට අවශ්‍ය පණිවුඩය ලැබෙන්නේය. මෙම කෙටි කිරීම කාලයට  පමණක් නොව අවකාශයටද අදාල වන්නේය. දෘශ්‍ය සංස්කරණය තුළත් එකම කතාවකදී තත්පර කීපයක් ඇතුලත එක් තැනකින් තවත් තැනකට පැන්නවිය හැකිය. එම නිසා ශ්‍රව්‍ය

සංස්කරණය තුලදී යම් දෙයකට අදාල රූප රාමුවක් හොඳ හැඟීමක් ගෙන දෙන අන්දමින් ආරක්ෂා සහිතව එක් කර තැබීම සිදුවේ.ප්‍රවෘත්ති සංස්කරණයේදී ප්‍රවෘත්ති සංස්කාරකවරයාට මෙන්ම ශ්‍රව්‍ය පට සංස්කාරකවරයාටද වැඩි වගකීමක් පැවරේ.

## ගුවන් විදුලි ප්‍රවෘත්තියක ප්‍රබලතාව හා දුබලතාව

ඕනෑම ජනමාධ්‍යයක එහි ප්‍රබලත්වය හා දුබලත්වය යන සාධක ද්විත්වයම අන්තර්ගතව පවතී. මාධ්‍ය භාවිතයේදී ප්‍රබලතාව උපරිම අයුරින් භාවිතා කිරීමටත් දුබලතාව අවම කිරීමටත් කටයුතු කළ යුතුය.එහෙත් දුබලතාව මුළුමනින්ම අතික්‍රමණය කිරීමට නොලැබේ. මෙය මාධ්‍ය භාවිතයේදී මුහුණ දීමට සිදුවන ප්‍රබල සීමාවකි. මාධ්‍ය සතුව පවතින නෛසර්ගික ස්වභාවය තේරුම් ගත යුතුය. සාර්ථක මාධ්‍ය වේදියකු යනු මෙම ස්වභාව වටහා ගනිමින් කටයුතු කරන්නෙකි. (වලේබොඩ, 2010, පිටු : 37)

ශ්‍රව්‍ය  බව **ගුවන් විදුලි** ප්‍රවෘත්තියේ ප්‍රබලත්ව සාධක අතර ප්‍රධාන වේ. මෙය වෙනත් කිසිදු මාධ්‍යයක් සතු නොවන විශේෂ හැකියාවකි . යම් ප්‍රවෘත්තියකට අදාළ සියලුම තොරතුරු ශ්‍රව්‍ය මාධ්‍යයෙන් ග්‍රාහකයාට රැගෙන යාම මෙහිදී සිදුවේ. උදාහරණයක් වශයෙන් ගංවතුර තතවයක් සලකා බැලිය හැකිය. එහිදී ජලයෙන් මංමාවත්, නිවෙස්, යාන වාහන, යටවී තිබෙන අන්දම, ජනතාව අවතැන් වී සිටින ආකාරය, ගංවතුර තත්වය හේතුවෙන් පුද්ගලයන් ජීවිතක්ෂයට පත්ව ඇත්නම් ඒ පිළිබඳ සියලු තොරතුරු ශ්‍රව්‍ය මාධ්‍යය ඇසුරින් ග්‍රාහකයා වෙත රැගෙන යාමට අවස්ථාව උදාවේ. මෙයද **ගුවන් විදුලි** ප්‍රවෘත්තියක ප්‍රබලතාවය ඉස්මතු වී පෙනෙන අවස්ථාවකි.

ක්ෂණික බව පිළිබඳ විමසා බැලීමේදී වර් තමානයේදී **ගුවන් විදුලි** ප්‍රවෘත්තිවල ප්‍රබලතාවය මෙන්ම දුබලතාවයද ඉස්මතු වී පෙනේ. Breaking news යන සම්ප්‍රදාය ඇතිවීමත් සමගම **ගුවන් විදුලි** ප්‍රවෘත්ති තුළ මෙම ක්ෂණික බව යන්න වඩාත් ඉස්මතු වී පෙනේ. (වලේබොඩ, 2010, පිටු : 38) මෙම ක්ෂණික බව යන සාධකය බීබීසී, සී.එන්.එන්. අල්ජසීරා වැනි ජාත්‍යන්තර මාධ්‍ය තුළ ඉතා ප්‍රබල ලෙස දක්නට ලැබේ. මෙම ක්ෂණික බව නම්වූ සාධකය ගුවන් විදුලි මාධ්‍යය තුළ දක්නට ලැබීමේ වැඩි ප්‍රවණතාවයක් ඇත. දුරස්ථ ස්ථානයක සිට ප්‍රවෘත්තියක් වාර්තා කිරීමට ගුවන් විදුලි මාධ්‍යයට හැකියාව තිබේ. අවශ්‍ය වන්නේ ජංගම දුරකථනයක් සහිතව සිදුවීම සිදුවූ ස්ථානයට වාර්තාකරුවෙකු ළඟාවීම පමණකි.

**ගුවන් විදුලියේ** ප්‍රවෘත්තිය ඉතා ප්‍රබලව ග්‍රාහකයාට සන්නිවේදනය වේ. එය න්‍යායික පිළිගැනීමකි. මෙම ප්‍රබලත්වය ඉක්මවීමට වෙනත් කිසිදු මාධ්‍යයකට හැකියාව නැත. රූපවාහිනී ප්‍රවෘත්තියක ශ්‍රව්‍ය දෘශ්‍ය භාවය නිසා ප්‍රවෘත්තිය පිළිබඳව සමස්තය ඉදිරිපත් කිරීමට එයට අවස්ථාව උදාවේ.

**ගුවන් විදුලි** ප්‍රවෘත්ති ප්‍රකාශය නිවැරදි වේලාවට ඇසිය යුතුය. **ගුවන් විදුලි** ප්‍රවෘත්ති යනු අසනු ලබන වැඩසටහන් විශේෂයකි. යම් ග්‍රාහකයකු හට නියමිත වේලාවට ප්‍රවෘත්ති නැරඹීමට අවකාශයක් නොලැබුනහොත් එය යළිත් නැරඹීමට අවස්ථාව නැත. පුවත්පතක පවතින පරිශීලන හැකියාව රූපවාහිනී ප්‍රවෘත්තියක් තුළ දක්නට නොමැතිවීම එහි දක්නට දුබලතාවයකි. (ගුණසේකර, 2008, පිටු : 38)

වෙනත් කාර්යයක් කරන අතරතුර ප්‍රවෘත්ති ප්‍රකාශය ඇසීමට හැකි වීමද ප්‍රබලතාවයකි. මෙහි දුබලතාවය වන්නේ වෙනත් කාර්යයක් කරමින් ඇසීම නිසා ප්‍රවෘත්ති ප්‍රකාශය කෙරෙහි පූර්ණ අවධානය යොමු නොවීමයි. ගුවන් විදුලි  ප්‍රවෘත්ති සම්බන්ධවද මේ දුබලතාවය තරමකට දක්නට ලැබේ. පුවත්පතක පළවන ප්‍රවෘත්තියක් නම් පූර්ණ අවධානය දෙමින් කියවිය යුතුය.

වර්තමානය වන විට **ගුවන් විදුලි** ප්‍රවෘත්ති ග්‍රාහකයා අභිමත ස්ථානයක සිය නැරඹිය හැකි මට්ටමට සකස් වෙමින් පවතී. අද වන විට ජංගම දුරකථනය මගින් ප්‍රවෘත්ති ප්‍රකාශය නැරඹීමටද අවස්ථාව උදා වී ඇත. එම හැකියාව සෑම පුද්ගලයකුටම සතු නොවන නිසා යම් දුබලතාවයක්ද දක්නට ලැබේ. **ගුවන් විදුලි** ප්‍රවෘත්ති පූර්ව ශික්ෂණයකින් තොරව ඇසිය හැකිවේ. පුවත්පත් කියවීම සඳහා භාෂා දැනුමක් තිබිය යුතුය. මෙය පුහුණුවීමෙන් ලබා ගත යුතු කුසලතාවයකි. ඕනෑම තරාතිරමක පුද්ගලයකුට **ගුවන් විදුලි** ප්‍රවෘත්ති අසා තේරුම් ගත හැකිය. (වලේබොඩ, 2010, පිටු : 40)

ප්‍රවෘත්තියක් පණිවුඩයක් පමණක්ම නොවේ. එය සමාජ සංසිද්ධියක් හෝ සිදුවීමක් ආශ්‍රිතව ජනනය වන්නකි. මේ අනුව ප්‍රවෘත්තියේ සමස්ථය තේරුම් ගැනීම සඳහා එම පසුබිම පිළිබඳ අවබෝධයක් තිබීම වැදගත්ය. ප්‍රවෘත්ති ඉදිරිපත් කරන ආයතනයේ ප්‍රතිපත්ති පිළිබඳ ස්වරූපය, පක්ෂපාතීත්වය, සමකාලීන සමාජ ප්‍රවණතා, ආශ්‍රිතව ඉදිරිපත් කෙරෙන ප්‍රවෘත්තියට වටහාගත යුතුය. ප්‍රවෘත්තියට කවර ආකාරයක ප්‍රචාරන වේශයක් දී තිබේ, එය අතිශයෝක්තියට පත් කර තිබේද, යන්න අවබෝධ කර ගත හැක්කේ මෙම පසුබිම පිළිබඳව අවබෝධයෙනි. මේ අනුව පූර්ව ශික්ෂනය පිළිබඳ සාධකය පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරන බව තේරුම් ගත හැකිය.

විශේෂයෙන් අන් මාධ්‍යවල ප්‍රවෘත්ති දෙස විමසා බැලීමේදී **ගුවන් විදුලි** ප්‍රවෘත්ති තුළ විශේෂයත්වයක් දක්නට ලැබේ. ශ්‍රව්‍ය මාධ්‍යයක් වීම හේතුවෙන්ම ඒ තුළ විශේෂ හැකියාවක් දක්නට ලැබේ. දුබලතා දක්නට ලැබෙන්නේ අන් මාධ්‍යවල ප්‍රවෘත්ති වලට වඩා දුලබ වශයෙනි. **ගුවන් විදුලි** ප්‍රවෘත්තියක ප්‍රබලතාවය හා දුබලතාවය පිළිබඳ ඉහත පරිදි විග්‍රහ කළ හැකිය.

## ගුවන් විදුලි ප්‍රවෘත්ති කාමරයක සාමූහික ක්‍රියාකාරීත්වය

ප්‍රවෘත්ති කාමරයක් යනු සංකීර්ණ ක්‍රියාදාමයක් සිදුවන ස්ථානයකි. ඉතා කෙට කාලයක් තුළ තීරණගත යුතු ස්ථානයකි. මෙකී ප්‍රවෘත්ති කාමරය තුළ සාමූහික ක්‍රියාකාරීත්වය පිළිබඳව විශ්වාස තබා ඇත. සාමූහික ක්‍රියාකාරීත්වය නොමැති නම් කිසිසේත් රූපවාහිනී ප්‍රවෘත්ති කාමරයක ක්‍රියාකාරීත්වය රඳා පවතින්නේ නැත. ප්‍රවෘත්ති කාමරයක ක්‍රියාකාරීත්වය රිලේ ධාවන තරඟයකට සමාන වේ. එක් ක්‍රිඩකයකු විසින් දෙනු ලබන යෂ්ටිය සාර්ථකව ගෙන ගොස් අනෙක් ක්‍රීඩකයාට දියු යුතුවේ. එක් එක් ක්‍රිඩකයන් අතර මනා සහයෝගීතාවයක් හා සාමූහික හැඟීමක් නොමැති නම් රිලේ ධවෙන ක්‍රීඩාවෙන් ජයගත නොහැකිය. එසේම ප්‍රවෘත්ති කාමරයකද සේවකයන් අතර මනා සහයෝගීතාවයක් හා සාමූහික හැඟීමක් පැවතිය යුතුය. (කුමාර, 2009, පිටු : 27) විශේෂයෙන් ප්‍රවෘත්ති වාර්තාකරුවන් හා සංස්කාරකවරු අතර පවතින සාමූහික හැඟීම බෙහෙවින් වැදගත්ය.

විශේෂයෙන් **ගුවන් විදුලි** ප්‍රවෘත්ති කාමරයක සාමූහික ක්‍රියාකාරීත්වය අතිශය ප්‍රබල ලෙස පැවතිය යුතුය. එහිදී අවම වශයෙන් ප්‍රවෘත්ති වාර්තාකරුවා, හා සංස්කරණ ශිල්පීයාත් අතර සාමූහිකත්වයක් නොමැති වුවහොත් සාර්ථක ප්‍රවෘත්තියක් නිෂ්පාදනය කර ගැනීම එතරම් පහසු නොවේ. (වීරකෝන්, 2006, පිටු : 112) සැබෑ ප්‍රවෘත්තියක් බිහිවන්නේ කවර මොහොතකදීද යන්න තීරනය කරගත නොහැකි නිසා කලින් සාකච්ඡා කර ඒ පිළිබඳව ලබා ගන්නා වූ පූර්ණ අවබෝධය හැම විටම සාර්ථක ප්‍රතිඵල ගෙන දීමට සමත්වේ. විශේෂයෙන් වාර්තාකරුවා සමඟ සමානව කටයුතු කිරීමට ප්‍රවෘත්ති සංස්කාරකවරයා වගබලා ගත යුතුය. එය අතිශය වැදගත් වේ.

සාමූහික ක්‍රියාකාරීත්වයක් තුළින් **ගුවන් විදුලි** ප්‍රවෘත්ති කාමරයක ක්‍රියාකාරීත්වය ඉහළ යයි. එසේම ඉන් සේවකයන්ගේ උද්යෝගය ඉහළ නැංවෙන අතර ඉහළ ගුණාත්මක බවකින් යුතු

ප්‍රතිඵලයක් ලබා ගැනීමට ඉඩ සැලසේ. ප්‍රවෘත්ති කාමරයේ සේවකයන්ගේ ඉගෙනීම ඉහළ නැංවීමද සාමූහික ක්‍රියාකාරීත්වයෙන් සිදුවන අතර නව්‍ය නිර්මාණශීලී දෑ බිහි කිරීමට එය හේතු වනු ඇත.

**ගුවන් විදුලි** ප්‍රවෘත්ති කාමරය තුල සාමූහික ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම සඳහා එහි සාමාජියයන් තුළ පවතින නිහතමානීත්වය අතිශය වැදගත් වේ. එයින් ලබාගත හැකි ප්‍රයෝජන රැසකි. ක්ෂේත්‍රයේ සිටින ප්‍රවීණයන්ගේ අත්දැකීම් ආධුනිකයන්ට ප්‍රදීපාගාරය හා සමානය. නමුත් එම අත්දැකීම් බෙදා හදා ගත යුතු වන්නේ ඔවුන් සමඟ මනාවූ අන්තර් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමෙනි. (වීරකොන්, 2008, පිටු : 115)

ප්‍රවෘත්ති අංශයක සාමූහික ක්‍රියාකාරීත්වය බිඳවැටුණු විට සේවකයන්ගේ චිත්ත ධෛර්යයද බිඳ වැටේ. අඩු ඵලදායීතාවයක් ඔවුන්ගේ වාර්තා වන අතර නිර්මාණශීලීත්වයෙන් තොරවූ ප්‍රතිඵලයක් බොහෝ විට දැක ගැනීමට හැකිවේ. (කුමාර, 2009, පිටු : 28) විශේෂයෙන් තරුණ නිර්මාණශීලී අදහස් වලට පාලනයෙන් යුතුව ඉඩ ප්‍රස්ථාව සලසා දිය යුතුය. නැතහොත් සිදුවන්නේ ඔවුන්ගේ උත්සාහය හා උනන්දුව හීනවී ගොස් උකටලී වීමයි. එවිට දම්වැලක පුරුක් හා සමාන ප්‍රවෘත්ති අංශයේ ශක්තිය දවසින් දවස දුබලතාවය කරා ගමන් කරයිත එහි දිගු කාලීන ප්‍රතිඵලය වන්නේ ආයතනික වශයෙන් ගරා වැටීමකට ලක් වීමයි.

විශේෂයෙන් ප්‍රවෘත්ති කාමරයක ක්‍රියාකාරීත්වය හොඳින් පවත්වා ගැනීමට හෝ දුර්වල වීමට බලපාන කරුණු ගණනාවක් පෙන්වා දිය හැකිය. පුද්ගලයන්ගේ චරිත ස්වභාවය ඔවුන්ගේ සමාජ ආකල්ප, ප්‍රවෘත්ති කාමරයේ පවතින දෛනික පුරුදු, ආයතනයේ ඇති ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි, ඉදිරිපත් කරන ප්‍රවෘත්ති හා තොරතුරුවල ස්වභාවය, වැනි කරුණු ඒ යටතේ විග්‍රහ කෙරේ.

එමෙන්ම ප්‍රවෘත්ති කාමරයේ සාමාජිකයන් තුළ පවතින ආතතිය තුරන් කිරීමට කටයුතු කළ යුතුය. සේවකයන් තුළ ආතති පවතින විට ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය අඩපණ වේ. එය ආයතනික වශයෙන් කාර්යක්ෂමතාවය බිඳ වැටීමට හේතුවේ. මේ අනුව පෙනී යන්නේ ප්‍රවෘත්ති අංශයේ සාමාජිකයන් තුළ පවතින ආතතිය තුරන් කිරීමද එහි සාමූහික ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමට හේතු වන බවයි.

## මූලාශ්‍ර


ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (සිංහල)

1. අත්තනායක, බන්දුල :- 1992, ජනසන්නිවේදනය අත්පොත, තරංජී ප්‍රකාශන, නාවින්න.
2. ඇතුගල ආරියරත්න, :- 1994, සන්නිවේදකයා, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
3. කරුණානායක, නන්දන :- 1995, විද්‍යුත් සන්නිවේදනය සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය.
4. කාරියවසම්, තිස්ස :- 1993, අන්තර්ජාතික ප්‍රවෘත්ති ආයතන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
5. කාරියවසම්, තිස්ස :- 1993, ප්‍රවෘත්ති රචනය සහ වාර්තාකරණය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
6. කුමාර, අශෝක :- 2008, නූතන ප්‍රවෘත්ති කලාව, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
7. කුමාර, දර්ශන අශෝක :- 2009, නව කළමණාකරන සංකල්ප හා ප්‍රවෘත්ති කාමරය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
8. කුරුප්පු, සී.පී. :- 1991, නව ප්‍රවෘත්ති කලාව, කර්තෘ ප්‍රකාශන
9. ගුණසේකර, රංජිත්, හෝ :- 1998, ජනමාධ්‍යවේදීන්ට උපදේශ, කතෘ ප්‍රකාශන
10. ගුණසේකර, රංජිත්, හෝ :- 2006, ප්‍රවෘත්තිකරණය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

11. ජගත්චන්ද්‍ර, නිහාල්, :- 2003, ප්‍රවෘත්ති සහ වාර්තාකරණය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
12. ජයසිංහ, ගම්‍යමාන, :- 1989, කළමණාකරණය හැඳින්වීම, කර්තෘ ප්‍රකාශන
13. ඩයස්, සිඩ්නි මාක්ස්, :- 2007, සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය, තෝතැන්න ප්‍රකාශන, ආණමඩුව.
14. දිසානායක, ධම්මික ගංහානාත්, :- 1999, රූපවාහිනී ප්‍රවෘත්ති නිෂ්පාදනය, එෆ්.ර්.එස්. ප්‍රකාශන, කොළඹ 04.
15. නිලේශාන්ත, කිත්සිරි, :- 1987, පුවත්පත් කලා ප්‍රවේශය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
16. පියදාස, රෝහණ ලක්ෂ්මන් , :- 1993, ප්‍රවෘත්ති පත්‍ර කලාව මතවාද හා විමර්ශන, කතෘ ප්‍රකාශන
17. පෙරේරා කේ. එස්, :- 1998, පුවත්පත් කලා සමීක්ෂණ, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, කොළඹ.
18. බෝගමුව, චන්ද්‍රසිරි , :- 2007, රූපවාහිනි විද්‍යාව හා කලාව, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුල්ලේරියාව
19. මහේන්ද්‍ර, සුනන්ද, :- 1997, සන්නිවේදන ශබ්දාගාරය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
20. රත්නසිංහ, පියදාස, :- 2006, ඇසි දිසි මායාව, කතෘ ප්‍රකාශන
21. රාජපක්ෂ, විජයදාය, :- 2009, සන්නිවේදන මූලධර්ම, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
22. ලියනගේ, ඉන්ද්‍රජිත්, :- 2001, මුහුණට මුහුණ, කතෘ ප්‍රකාශන
23. වලේබොඩ, කමල්, :- 2010, ගුවන්විදුලි ප්‍රවෘත්ති සම්පාදනය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
24. විජේකෝන්, චන්දන, :- 2006, පුවත්පතේ කතන්දරේ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
25. වීරකෝන්, ඉන්දික, :- 2006, රූපවාහිනි ප්‍රවෘත්තිකරණය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
26. වීරසිංහ ටියුඩර්, රාජපක්ෂ, චන්ද්‍රසිරි, :- 2002, ජනමාධ්‍යවේදය, සංහිඳ ප්‍රකාශකයෝ
27. වැලිවිට, ඇල්බට්, :- 1992, පුවත්පත් කලාව, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
28. සෙනෙවිරත්න, නිව්ටන්, :- 2001, ජනසන්නිවේදනයේ ප්‍රවෘත්ති කලාව, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
29. සෙනෙවිරත්න, සේනක, :- 2007, ප්‍රවෘත්ති කලාවේ මූලිකාංග න්‍යායන් හා සංකල්ප, කතෘ ප්‍රකාශන
30. හෙට්ටිගේ, දිවානි, :- 2009, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය, කතෘ ප්‍රකාශන

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (ඉංග්‍රීසි)

1. Bergin, Francis J:- Practical Communication ELBS /pitman second Edition, CAS (1981)
2. Dennis, E :- Understanding Mass communication, 1994, Houghttion Miffin Company, Boston
3. Herbert John, Joarnalism in the digitalage – Theory & Practice for Broadcast, print and online media, 2001, focal Press, oxford
4. Lambert, A:- British Broadcasting, 1977, Routledge, London
5. Mencher, Meioin:- Basic News Writing, 1990, Universal Book Stall, New Delhi.

වෙබ් අඩවි

1. http://highschooljournalism.org
2. http://www.academies,smcut.edu
3. http://www.ansaers.com
4. http://www.bbc,co.uk
5. http://www.britanicaonline.com
6. http://www.managmentfirst.com
7. http://www.neaslab.org